# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය

**ශ්‍රී ලංකා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ද; 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් 2025 නොවැම්බර් මස 26 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 නොවැම්බර් මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[39 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 332.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය

එල්. ඩී. - ඕ 49/2025

**ශ්‍රී ලංකා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ද; 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** (1) මේ පනත 2025 අංක  දරන ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන, (මෙහි මින් මතු “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ පනතක් බවට පත් වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම

**2.** (1) (මේ පනතේ “අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති

සංස්ථාපිත මණ්ඩලක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

අධිකාරියේ පරමාර්ථ

**3.** අධිකාරියේ පරමාර්ථ විය යුත්තේ-

(අ) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ආ) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඇ) ලියාපදිංචි සමුපකාර සමිති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති, ගොවි සංවිධාන, කොටස් තැරැව්කරුවන් සහ රක්ෂණ ව්‍යාපාරය නියාමනය කරන සහ අධීක්ෂණය කරනු ලබන මහ බැංකුව සහ අදාළ නියාමන අධිකාරි සමඟ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඈ) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන්ගේ සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම.

අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**4.** අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය -

(අ) මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තන් සඳහා බලපත්‍ර දීම සහ ඔවුන් නියාමනය කිරීම;

(ආ) මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තන් අධීක්ෂණය කිරීම;

(ඇ) වෙළෙඳපොළ හැසිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති නිශ්චය කිරීම සහ නව වෙළෙඳපොළ ප්‍රවනතාවන්ට අනුකූලව බලපත්‍රලාභීන් අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම;

(ඇ) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන අතර වගකිව යුතු ණය දීමේ සංස්කෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව හැර, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය ඇතුළු නියාමන අධිකාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම;

(ඉ) රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, පළාත් අධිකාරීන් සහ වෙනත් පෞද්ගලික හෝ රාජ්‍ය මණ්ඩල, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු සමඟ සබඳතා පැවැත්වීම සහ ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීම;

(ඊ) මහජනයා සඳහා ණය උපදේශන සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සහ මුදල් ණයට දීම සහ ක්ෂුද්‍රමූල්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම;

(උ) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම සහ එම පැමිණිලි සම්බන්ධයෙන් දත්ත සමුදායක් පවත්වාගෙන යාම;

(ඌ) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන සම්බන්ධයෙන් දත්ත සමුදායක් පවත්වාගෙන යාම;

(එ) මුදල් ණයට දීමේ සහ ක්ෂුද්‍රමූල්‍ය කටයුතු පිළිබඳ සමීක්ෂණ සහ පර්යේෂණ සිදු කිරීම;

(ඒ) අධිකාරියට අයත් චංචල හෝ නිශ්චල දේපළ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම, උකස් කිරීම, ප්‍රදානය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඔ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම:

එසේ වුව ද, සියලු විදේශීය ප්‍රදාන, පරිත්‍යාග සහ රික්තවරණ සම්බන්ධයෙන්, අධිකාරිය විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඕ) සෘජුව ම හෝ තත්කාර්ය සඳහා අධිකාරි විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් හෝ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම;

(ක) අධිකාරිය විසින් උචිත යයි සලකනු ලැබිය හැකි පරිදි යම් බැංකුවක යම් ගිණුමක් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සහ පවත්නා අදාළ ලිඛිත නීතිවලට අනුකූලව එම ගිණුම ක්‍රියාත්මක කිරීම;

(ග) අධිකාරියේ අරමුදල කළමනාකරණය කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ච) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම;

(ජ) 15 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එහි කර්තව්‍ය කිසිවක් බැහැරින් සපයා ගැනීම;

(ට) සේවානියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් වන විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ එම සේවානියුක්තයන්ට නිවාඩු සහ වෙනත් චේතන ලබාදීම සම්බන්ධයෙන් වන කාර්යපටිපාටියක් සකස් කිරීම;

(ඩ) අධිකාරියේ අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(ණ) අධිකාරිය විසින් ලබා දෙන ලද යම් සේවාවන් සඳහා ගාස්තු අයකිරීම හෝ අයකිරීම් අයකර ගැනීම; සහ

(ත) මේ පනතේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ මේ පනත යටතේ අධිකාරියට පවරා ඇති බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ආනුෂංගික හෝ සුදුසු විය හැකි වෙනත් සියලු ක්‍රියා කිරීම,

විය යුතු ය.

## II වන කොටස

## අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

**5.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම, පාලනය කිරීම (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් සතු විය යුතු ය.

(2) මණ්ඩලය විසින්, අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මේ පනතින් අධිකාරිය වෙත පිරිනමන ලද, පවරන ලද හෝ නියම කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය -

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්, එනම් -

(i) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන, මහා භාණ්ඩාගාරයේ

නියෝජ්‍ය ලේකම්වරයකු වන්නා වූ, ඔහුගේ නියෝජිතයකුගෙන්;

(ii) මහ බැංකුව විසින් නම් කරනු ලබන, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා හෝ ඔහු නොසිටින විට, මහ බැංකුව විසින් තත්කාලය සඳහා නම් කරනු ලබන නියෝජ්‍ය අධිපතිවරයකුගෙන්; සහ

(iii) ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා හෝ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන, ඔහුගේ නියෝජිතයකුගෙන්;

(ආ) (මෙහි මින් මතු ''පත් කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් සිව්දෙනාගෙන්; එනම් -

(i) ක්ෂුද්‍රමූල්‍ය පිළිබඳ විශේෂඥතාව ඇති, විශිෂ්ටතාව අත්කරගෙන ඇති සහ පළපුරුද්ද ඇති සාමාජිකයකුගෙන්;

(ii) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක් හෝ වැඩි සංඛ්‍යාවක් පිළිබඳ විශේෂඥතාව ඇති, විශිෂ්ටතාව අත්කරගෙන ඇති සහ පළපුරුද්ද ඇති සාමාජිකයෙකුගෙන්:-

(අ) බැංකුකරණය;
(ආ) ගිණුම්කරණය;
(ඇ) නීතිය;
(ඈ) පරිපාලනය; හෝ
(ඉ) වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයක්; සහ

(iii) ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා විසින් නම් කරනු ලබන බැංකුකරණය, මූල්‍ය, ක්ෂුද්‍රමූල්‍ය, ගිණුම්කරණය, නීතිය, පරිපාලනය යන ක්ෂේත්‍රයන් හෝ වෙනත් යම් අදාළ විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් සතු වන්නා වූ ද, පළපුරුද්ද ඇත්තා වූ ද වෙනත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය:

එසේ වුව ද, පත් කළ සාමාජිකයන් අතරින්, යටත් පිරිසෙයින්, එක් සාමාජිකයකුවත් කාන්තා සාමාජිකයකු විය යුතු ය.

අධිකාරියේ සභාපතිවරයා

**6.** (1) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකු අධිකාරියේ සභාපතිවරයා විය යුතු ය.

(2) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවකට පත් වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, සාමාන්‍යයෙන් සාමාජිකයකු ලෙස වන ස්වකීය කාර්යවලට අමතරව සභාපතිවරයා ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් නිල බලයෙන් පත් වන සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

**7.** යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් හෝ පත්වීමේ දිනයට පෙරාතුව ම වූ වසර දෙක තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකුව සිට ඇත්නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත්භාවයට පත් වූවකු හෝ බංකොලොත්භාවයට පත් වූවකු වන තැනැත්තකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ අත්හිටවූ දඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ විඳ ඇත්නම්;

(ඊ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ වන යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් සෘජුව ම හෝ අනාන්‍යාකාරයකින් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(උ) අධිකාරියේ සාමාජිකයකු ලෙස ඔහු විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අගතිගාමී ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්,

එම තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ දිගට ම කටයුතු කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය.

**8.** මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර එවැනි යම් සාමාජිකයකු අනුගාමී වන හෝ අන්‍යාකාරයකින් වන වැඩිදුරටත් වූ කාලසීමා තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**9.** (1) තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක පත් කළ සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

පත් කළ සාමාජිකයින් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

(2) රෝගාතුරවීම, අශක්නුතාවකට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැළකිල්ලට ගනිමින් ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි කිසිදු පත් කිරීමක් මාස තුනක් ඉක්මවන කාලසීමාවක් සඳහා සිදු කරනු නොලැබිය යුතු ය. එකී මාස තුනක කාලසීමාව ඉකුත්වීමෙන් පසු, එකී රෝගාතුරවීම, අශක්නුතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම තවදුරටත් පවතින්නේ නම්, එකී කාලසීමාව ඉකුත් වූ දින සිට එකී සාමාජිකයා ධුරය දැරීම නතර වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් යම් පත් කළ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් මණ්ඩලයේ සේවය කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතු ය.

(4) පත් කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින්, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැළකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කළ තැනැත්තා, තමා අනුප්‍රාප්තික වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවා ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

ගණපූරණය සහ මණ්ඩලයේ රැස්වීම

**10.** (1) මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින්, මාස තුනකට වරක්වත් පවත්වනු ලැබිය යුතු ය. එසේ වුව ද, යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවක් ඇති වුවහොත්, සභාපතිවරයා විසින් විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(3) සභාපතිවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකට ම පැමිණ සිටිය යුතු අතර, සභාපතිවරයා විසින් එකී සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් -

(අ) ගණපූරණයක් සංස්ථාපනය වන සාමාජිකයන් සංඛ්‍යාව රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයක දී, දිනයක දී සහ වේලාවක දී රැස්වීම මගින්; හෝ

(ආ) සහභාගී වී සිටින ගණපූරණයක් සංස්ථාපනය වන සියලු සාමාජිකයන්ට රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ ඊට සහභාගී වී සිටින එක් එක් සාමාජිකයා එකවර දැකගැනීමට ද ඔවුන්ට සවන් දීමට ද හැකිවන ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මාර්ගයෙන්,

පවත්වනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලය විසින්, මණ්ඩලයේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ඔවුන්ගේ අදහස් ලබා ගැනීමේ කාර්යය සඳහා, අදාළ විෂයය කරුණක් පිළිබඳ යම් විශේෂඥයකුට හෝ නිලධරයකුට මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගීවන ලෙස ආරාධනා කරනු ලැබිය හැකි නමුත් එම තැනැත්තාට හෝ නිලධරයාට එම රැස්වීමේ දී ඡන්දය දීමේ අයිතිය නොතිබිය යුතු ය.

(6) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු කරුණු එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(7) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම්වල සහ එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව

**11.** 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මතම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්, විශේෂඥයන් හෝ නිලධරයන්ගේ පාරිශ්‍රමික

**12.** කලින් කළ, නිකුත් කරනු ලබන අදාළ රජයේ චක්‍රලේඛවලට අනුකූලව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ මත, මණ්ඩලයේ සාමාජිකයන්ට, යම් විශේෂඥයකුට හෝ නිලධරයකුට ඔහු රැස්වීමකට සහභාගීවන එක් එක් දිනය සඳහා යම් දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය.

**13.** (1) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින්, කලින් කළ, තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තන් භාරයේ තැබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන්ගේ අනුමතය ඇතිව සහ මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනෙකු හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ඉදිරිපිට දී මිස, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින්, අධිකාරියේ මුද්‍රාව යොදා ඇති සාධනපත්‍ර සහ ලේඛන පිළිබඳ නාමලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

**14.** එසේ කිරීමට අවශ්‍ය යයි මණ්ඩලයේ සාමාජිකයන් විසින් සලකනු ලබන අවස්ථාවක, අධිකාරිය විසින්, ශ්‍රී ලංකාව ඇතුළත යම් ස්ථානයක එහි ශාඛා පිහිටුවනු ලැබිය හැකි ය.

අධිකාරියේ ශාඛා

**15.** (1) එසේ කිරීම අවශ්‍ය යයි ද යෝග්‍ය යයි ද අධිකාරිය විසින් සලකනු ලබන කවර වූ හෝ විටක දී, අධිකාරිය විසින්, බලපත්‍ර දීම, පනත යටතේ අයකරනු ලබන ගාස්තු හෝ අයකිරීම් එකතු කිරීම සහ බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමට අදාළ ස්වකීය බලතල හෝ කර්තව්‍ය කිසිවක් අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික් ලේකම්වරයකු වෙත හෝ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ප්‍රාදේශීය ලේකම්වරයකු වෙත හෝ පවරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එම දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ප්‍රාදේශීය ලේකම්වරයා විසින් තමා වෙත පවරන ලද එකී බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා අධිකාරිය විසින් වගකීම දරනු ලැබිය යුතු අතර, එය අඛණ්ඩව දැරිය යුතු ය.

අධිකාරිය විසින් යම් බලයක්, කර්තව්‍යයක් පැවරීම

(2) අධිකාරිය විසින්, අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි, මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලබන යම් විධානයක් හෝ රීතියක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් දිස්ත්‍රික් ලේකම්වරයකු වෙත හෝ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක යම් ප්‍රාදේශීය ලේකම්වරයකු වෙත නිර්දේශන නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් නිර්දේශනයක් නිකුත්කර ඇත්තේ යම් නිලධරයකු වෙත ද, එකී සෑම නිලධරයකු විසින් ම ඊට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

වෙනත් ආයතන සමඟ ඇතිකර ගනු ලබන ගිවිසුම්

**16**. අධිකාරිය විසින්, මේ පනතේ විෂය පථයට අයත් යම් කරුණක් සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමට අදාළව යම් රජයේ ආයතනයක් හෝ සංවිධානයක් හෝ එහි නියෝජ්‍යායතන කිසිවක් හෝ යම් දේශීය හෝ විදේශීය නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් සමඟ යම් ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් ඇති කරගනු ලැබිය හැකි ය.

## III වන කොටස

## අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා

**17.** (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයකු පත්කරනු ලැබිය යුතු අතර, එකී අධ්‍යක්ෂ-ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා ද ලේකම්වරයා ද විය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය නිර්දේශනවලට යටත්ව, අධිකාරියේ ව්‍යාපාර කටයුතු මෙහෙයවීම, අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අධිකාරියේ සේවානියුක්තයන් සම්බන්ධයෙන් වන පරිපාලනමය පාලනය භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අධිකාරියේ ලිඛිත අනුමතය ඇතිව, කලින් කළ, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි

ඔහුගේ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය අධිකාරියේ වෙනත් යම් සේවානියුක්තයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, එම සේවානියුක්තයා විසින් තමා වෙත පවරන ලද එකී බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වගකීම දරනු ලැබිය යුතු අතර, එය අඛණ්ඩව දැරිය යුතු ය. තව ද, එසේ එවැනි යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරන ලද්දේ යම් සේවානියුක්තයකු වෙත ද, එම සේවානියුක්තයා විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ නිර්දේශනවලට යටත්ව එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් හෝ පත්වීමේ දිනයට පෙරාතුවූ ම වසර දෙක තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකුව සිට ඇත්නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත්භාවයට පත් වූවකු හෝ බංකොලොත්භාවයට පත් වූවකු වන තැනැත්තකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ අත්හිටවූ දඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ විඳ ඇත්නම්;

(ඊ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් ඍජුව ම හෝ අන්‍යාකාරයකින් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(උ) අධිකාරියේ සාමාජිකයකු ලෙස ඔහු විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අගතිගාමී ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්නම්,

එම තැනැත්තා අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව කටයුතු කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය.

(5) අධ්‍යක්ෂ-ජනරාල්වරයා -

(අ) ස්ථිර ලෙස ම ඔහුට ස්වකීය කාර්ය ඉටු කිරීමට නොහැකි වුවහොත්;

(ආ) අධිකාරියේ මතය අනුව වංචනික හෝ නීති විරෝධී ස්වභාවයෙන් යුතු වූ හෝ අධිකාරියේ සම්බන්ධතාවලට අගතිදායක ලෙස බලපාන්නා වූ යම් ක්‍රියාවක් කර ඇත්නම්; හෝ

(ඇ) අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් නිර්දේශනයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇත්නම්,

අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, එකී තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ-ජනරාල්වරයාට අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

**18.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් - අධිකාරියේ කාර්ය මණ්ඩලය

(අ) අධිකාරියේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලැබිය හැකි පරිදි යම් කාර්ය මණ්ඩලයක් පත් කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ආ) අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තයන්ගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම; සහ

(ඇ) අමාත්‍යවරයා විමසා එකී නිලධරයන් සහ සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අනුප්‍රමාණ නියම කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, අධිකාරිය විසින්, මේ පනත යටතේ වන ස්වකීය බලතල කිසිවක් අධිකාරියේ යම් නිලධරයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එම නිලධරයා විසින්, ඔහු වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා අධිකාරිය වගකීම දරනු ලැබිය යුතු අතර, අඛණ්ඩව වගකීම දැරිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(4) තත්කාර්ය සඳහා අධිකාරිය විසින් සාදනු ලබන රීති වෙතොත්, එම රීතිවලට යටත්ව ද ඊට අනුකූලව ද, අධිකාරිය විසින්, මේ පනතේ කාර්ය කිසිවක් සඳහා අධිකාරිය නියෝජනය

කිරීම සඳහා යම් නිලධරයකුට ලිඛිතව බලය දෙනු ලැබිය හැකි ය. එසේ වුව ද, එම බලය දීම යටතේ අධිකාරිය නියෝජනය කිරීමේ දී එම නිලධරයා විසින් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා අධිකාරිය වගකීම දරනු ලැබිය යුතු අතර, එය අඛණ්ඩව දැරිය යුතු ය.

(5) අධිකාරියේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(6) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(8) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට ගිවිසගෙන ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරන ලද කාලය, එම ගිවිසුම යටතේ වන බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා, රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) යම් තැනැත්තකු -

(අ) බරපතළ විෂමාචාරයට වරදකරු බවට තීරණය කරනු ලැබ ඇති;

(ආ) අනුක්‍රමිකතා සම්බන්ධයෙන් කලින් ධුරයෙන් පහකර ඇති; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති අවස්ථාවක,

අධිකාරිය විසින්, එකී තැනැත්තා අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත්කරනු නොලැබිය යුතු ය.

මහ බැංකුවේ නිලධරයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීම

**19.** (1) අධිකාරියේ ඉල්ලීම මත, මහ බැංකුවේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ මහ බැංකුවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය සහ මහ බැංකුව විසින් ගිවිස ගනු ලැබිය හැකි පරිදි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළු යම් නියම සහ කොන්දේසි මත අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත්කරනු ලබන අවස්ථාවක, අධිකාරියේ වෙනත් යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු මෙන් පවත්නා විනය පාලනයට ම, ඔහු යටත් විය යුතු ය.

## IV වන කොටස

## මුදල් ණයට දෙන්නන්

බලපත්‍රලත් තැනැත්තන් විසින් මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යා යුතු බව

**20.** (1) අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක් ඇතිව මිස, යම් තැනැත්තකු විසින් මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) (1) වන උපවගන්තියට අගතියක් නොමැතිව, (1) වන උපවගන්තියේ විධිවිධාන පහත දැක්වෙන ආයතන සඳහා අදාළ නොවිය යුතු ය:-

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක්;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව;

(ඇ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඈ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් මුදල් සමාගමක්;

(ඉ) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද, යම් ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක්;

(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් සහ පළාත් සභාවක ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක්;

(උ) 2013 අංක 1 දරන සමෘද්ධි පනත යටතේ පිහිටුවන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක් හෝ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක්;

(ඌ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ප්‍රකාර ඇති කරන ලද අස්තිත්වයක්;

(එ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් රක්ෂණ සමාගමක්;

(ඒ) සම්බන්ධිත සමාගම්වලට මුදල් ණයට දෙන යම් සමාගමක්;

(ඔ) ස්වකීය අධ්‍යක්ෂවරුන්, නිලධරයන් හෝ සේවා නියුක්තයන් වෙත ප්‍රදානය කරනු ලබන ප්‍රතිලාභයක් ලෙස එම තැනැත්තන්ට මුදල් ණයට දෙන යම් සමාගමක්;

(ඕ) විදේශීය ආණ්ඩුවක් හෝ විදේශීය ආණ්ඩුවක් වෙනුවෙන් ක්‍රියා කරන යම් නියෝජ්‍යායතනයක් හෝ ආයතනයක්;

(ක) නැවත ගොඩනැගීම හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව, අන්තර්ජාතික සංවර්ධන සංගමය, අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව, ආසියානු සංවර්ධන බැංකුව හෝ වෙනත් යම් බහුපාර්ශ්වීය ණය දෙන ආයතනයක්; සහ

(ග) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කරන ලද යම් කොටස් තැරැව්කරුවකු.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) යම් නිශ්චිත අවස්ථාවක් සඳහා පමණක් යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකුට ණයට දෙන ලද මුදල් ප්‍රමාණයක්; සහ

(ආ) බැඳුම්කර, සෘණ පත්‍ර හෝ දෙමුහුන් ණය සාධන පත්‍ර ඇතුළුව යම් ණය සාධන පත්‍රයක් සඳහා දායක මුදල් ලෙස ගෙවනු ලබන මුදල් ප්‍රමාණයක්,

සඳහා අදාළ නොවිය යුතු ය.

බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු ලෙස පෙනී සිටීම සම්බන්ධයෙන් වන තහනම

**21.** (1) මේ පනතේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව, යම් තැනැත්තකු විසින් බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු ලෙස පෙනී සිටිනු නොලැබිය යුතු අතර, “බලපත්‍රලත් මුදල් ණයට දෙන්නා” යන නාමය, ශීර්ෂය හෝ විස්තරය ලබා ගැනීම හෝ භාවිත කිරීම හෝ සඳහනකින් යොදා ගැනීම හෝ එම තැනැත්තා බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු වන්නේ ය යන අදහස අඟවන හෝ එම අදහස ඇති කිරීමට නැඹුරු කරවන යම් නාමයක්, ශීර්ෂයක් හෝ විස්තරයක්, ලබා ගැනීම හෝ භාවිත කිරීම හෝ යම් ස්ථානයක ඇලවීම හෝ ප්‍රදර්ශනය කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ගනුදෙනු සිදු කරනු ලබන වාර ගණන සහ එහි ලක්ෂණ සැලකිල්ලට ගනිමින්, අධිකාරිය විසින්, යම් තැනැත්තකු මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ යෙදී සිටින්නේ ද යන්න නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම

**22.** (1) මුදල් ණයට දෙන්නකු ලෙස ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන බලපත්‍රයක් සඳහා වන ඉල්ලීමක්, තත්කාර්ය සඳහා සාදනු ලබන රීතිවල දක්වා ඇති යම් ලේඛන හෝ තොරතුරු සහ පිරිසැකසුම් ගාස්තුවක් ද සමඟ එකී ආකෘති පත්‍රයට අනුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) 20 වන වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ වන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට පහත දැක්වෙන අස්තිත්වයන් සුදුසුකම් ලැබිය යුතු ය:-

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද්දා වූ ද, 2007 අංක 07 දරන සමාගම් පනතේ අර්ථානුකූලව අක්වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් නොවන්නා වූ ද සමාගමක්:

එසේ වුව ද, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද්දා වූ ද, රාජ්‍ය නොවන සංවිධානයක් මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය;

(ආ) (83 වන අධිකාරය වූ) හවුල් ව්‍යාපාර ආඥාපනත හෝ පළාත් සභාවක යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්;

(ඇ) (123 වන අධිකාරය වූ) සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ පාර්ලිමේන්තු පනතක් යටතේ සංස්ථාගත කරන ලද සමිතියක්; සහ

(ඈ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද භාරයක්.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ඉල්ලීමක් ලැබුණු පසු, තමා විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් විමසීම සිදු කර නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් තුළ ඉදිරිපත් කළයුතු යම් වැඩිදුර තොරතුරු සහ ලේඛන කැඳවීම ද, ඉල්ලුම්කරුගේ ව්‍යාපාර ස්ථානය හෝ ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කිරීමට කටයුතු සැලැස්වීම ද කරනු ලැබිය හැකි ය.

(4) ඉල්ලුම්කරු විසින්, (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියම කරන ලද යම් අතිරේක ලේඛන හෝ තොරතුරු එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ ලබා දී නොමැති අවස්ථාවක, අධිකාරිය විසින්, එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ තීරණය ඉල්ලුම්කරුට දන්වමින් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(5) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ඉල්ලීමෙන් ලබා දී ඇත්තා වූ ද, (3) වන උපවගන්තිය යටතේ කරන ලද තොරතුරු විමසීමෙන් හෝ පරීක්ෂණයෙන් ලබා ගෙන ඇත්තා වූ ද, තොරතුරු සලකා බැලීමෙන් පසු, එකී බලපත්‍රය ප්‍රදානය කරන ලෙස නැතහොත් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස අධිකාරියට නිර්දේශ කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් ප්‍රදානය කිරීම

**23.** (1) අධිකාරිය විසින්, 22 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කරන ලද නිර්දේශ සහ අධිකාරියේ මතය අනුව අදාළ වන්නා වූ වෙනත් යම් කරුණක් සලකා බැලීමෙන් පසු, -

(අ) අධිකාරිය විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කිරීම; හෝ

(ආ) 27 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) බලපත්‍රයේ කාලසීමාව තුළ ඕනෑම විටක දී, අධිකාරිය විසින්, එකී බලපත්‍රයේ නියම සහ කොන්දේසි කිසිවකට යමක් එකතු කිරීම, එම නියම සහ කොන්දේසි කිසිවක් අහෝසි කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් අලුත් කිරීම

**24.** (1) (අ) ස්වකීය බලපත්‍රය අලුත් කිරීමට අපේක්ෂා කරන (මෙහි මින් මතු "මුදල් ණයට දෙන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු විසින්, නිකුත් කරන ලද බලපත්‍රයේ කාලය ඉකුත් වන දිනට පෙරාතුව වූ දින හැටකට නොඅඩු කාලසීමාවක් තුළ ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලීමක්, තත්කාර්ය සඳහා සාදනු ලබන රීතිවල දක්වා ඇති යම් ලේඛන හෝ තොරතුරු

සහ පිරිසැකසුම් ගාස්තුවක් ද සමඟ එකී ආකෘති පත්‍රයට අනුකූලව අධ්‍යක්ෂ- ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මේ පනතේ 22 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම ඉල්ලීම පිරිසැකසීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවෙන් පසු ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, රුපියල් මිලියන දෙකක් නොඉක්මවන පරිපාලන ගාස්තුවකට යටත්ව එකී බලපත්‍රයේ කාලය ඉකුත් වන දිනට පෙරාතුව වූ දින තිහක් දක්වා අධ්‍යක්ෂ -ජනරාල්වරයා විසින් භාරගනු ලැබිය හැකි ය.

(3) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට අපොහොසත් වූ අවස්ථාවක, එම මුදල් ණයට දෙන්නාහට, තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ කාලය ඉකුත් වන දින සිට වසරක කාලසීමාවක් තුළ අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වන්නේ ය.

බලපත්‍රයේ කොන්දේසි

**25.** 23 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන හෝ 24 වන වගන්තිය යටතේ අලුත් කරනු ලබන බලපත්‍රයක් -

(අ) බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සහ නියමයන්ට යටත් විය යුතු ය;

(ආ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබීමට යටත් විය යුතු ය;

(ඇ) වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය;

(ඈ) කාලය ඉකුත් වන දිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය; සහ

(ඉ) පැවරිය නොහැකි විය යුතු ය.

ව්‍යාපාර ස්ථානවල බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම

**26.** මුදල් ණයට දෙන්නකු විසින්, සෑම විටක දී ම, අධිකාරිය විසින් ඔහු වෙත නිකුත් කරනු ලබන මුල් බලපත්‍රය ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ද එම බලපත්‍රයේ පිටපතක් අනෙකුත් සියලු ව්‍යාපාර ස්ථානවල ද පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

**27.** (1) මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා, 22 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ 24 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත් කිරීමට හෝ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින්, පහත දැක්වෙන හේතු කිසිවක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය:-

(අ) මේ කොටසට අනුකූලව ඉල්ලීම ඉදිරිපත් කර නොතිබීම;

(ආ) මේ පනතේ යම් නියමයක් හෝ මේ පනත යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු අසමත් වීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් අධිකාරිය වෙත සපයන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය වීම හෝ නොමඟයවනසුලු වීම හෝ එමගින් යම් වැදගත් තොරතුරක් ලබා දීම පැහැර හැර තිබීම;

(ඈ) බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ණය හිමියන්ගේ හෝ වෙනත් පරදු දරන්නන්ගේ සම්බන්ධතාවලට පටහැනි වන බවට අධිකාරියේ මතය වන්නේ නම්;

(ඉ) එය රටේ මූල්‍ය ක්ෂේත්‍රය සහ සමාජ ආර්ථික තත්ත්වයන්ට පටහැනි බව අධිකාරියේ මතය වීම;

(ඊ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් අධිකරණයක් විසින් ඉල්ලුම්කරු නිදහස් නොකළ බුන්වත් හෝ වස්තුභංගත්වයට

පත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීම හෝ ඉල්ලුම්කරුගේ මුදල් ණයට දීමේ ව්‍යාපාරය ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(උ) යම් විනිශ්චිත ණයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව වන ඇස්කීසි කිරීමක් මගින් එකී විනිශ්චිත ණයේ මුල් මුදල ම හෝ ඉන් කොටස් ගෙවා තෘප්ත කර නොතිබීම;

(ඌ) ඉල්ලුම්කරුගේ යම් දේපළක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තකු පත් කර තිබීම;

(එ) ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී එහි ණය හිමියන් සමඟ සමථයට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹ තිබීම සහ එම සමථය හෝ සමථ යෝජනා ක්‍රමය තවමත් ක්‍රියාත්මකව පැවතීම;

(ඒ) ඉල්ලුම්කරු සමාගමක් වන අවස්ථාවක, එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන් කිසිවකු, ඉල්ලුම්කරු සමිතියක් වන අවස්ථාවක, එහි යම් ධුර දරන නිලධරයකු, ඉල්ලුම්කරු හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක, එහි යම් හවුල්කරුවකු මේ කොටසේ මේ වගන්තියේ දක්වා ඇති නුසුදුසුකම් කිසිවකට යටත්ව තිබීම; හෝ

(ඔ) අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ එහි ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩලයේ නිලධරයන් කිසිවකු, ධුර දරන නිලධරයකුට හෝ හවුල්කරුවකුට එහි ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමට නොහැකි

යයි ඔවුන්ගේ කීර්තිය, චරිතය, මූල්‍යමය විශ්වසනීයත්වය සහ විශ්වසන්‍යතාව සැලකිල්ලට ගැනීමේ දී, විශ්වාස කිරීමට අධිකාරියට හේතු තිබීම.

(2) ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩලයේ නිලධරයකු 40 වන වගන්තියේ දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, දින තිහක් තුළ එම තීරණය ඉල්ලුම්කරු වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඔහුගේ ඉල්ලීම පිරිසැකසීමට නම්, අදාළ ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩලයේ නිලධරයා එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු බව ද, එමෙන්ම ඔහුගේ ඉල්ලීම පිරිසැකසීම ආරම්භ කිරීම සඳහා එම ඉවත් කිරීම අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දන්වනු ලැබිය යුතු බව ද: අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය.

(3) ඉල්ලුම්කරුට කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් තොරව, අධිකාරිය විසින්, බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම

**28.** (1) තත්කාර්ය සඳහා බලපත්‍රලාභියා වෙත යවනු ලබන නිවේදනයක් මගින්, මේ කොටස යටතේ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රය පහත දැක්වෙන ඕනෑම අවස්ථාවක දී අවලංගු කරනු ලැබිය හැකි ය:-

(අ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අධිකාරිය විසින් බලපත්‍රයක් සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි වූ යම් හේතුවක් පැවතීම;

(ආ) මුදල් ණයට දෙන්නා විසින් ස්වකීය බලපත්‍රය සම්බන්ධයෙන් වන යම් කොන්දේසියක් හෝ සීමාවක් උල්ලංඝනය කර තිබීම;

(ඇ) මුදල් ණයට දෙන්නා විසින්, අවස්ථාවෝචිත පරිදි, තමා බැඳී සිටින යම් රීතියක් උල්ලංඝනය කර තිබීම;

(ඈ) මුදල් ණයට දෙන්නා විසින්, අධිකාරිය වෙත අසත්‍ය, නොමඟයවනසුලු හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කර තිබීම හෝ අධිකාරියෙන් වැදගත් කරුණු සැඟවීම හෝ අධිකාරියට වැදගත් කරුණු හෙළිදරව් කිරීම පැහැර හැරීම හෝ යම් වැදගත් කරුණක් වරදවා දැක්වීම මත ඔහුට බලපත්‍රය නිකුත් කර තිබීම;

(ඉ) මුදල් ණයට දෙන්නා විසින්, වාර්ෂික බලපත්‍ර ගාස්තුව හෝ මේ පනත යටතේ පනවනු ලබන යම් පරිපාලන ගාස්තුවක් ගෙවීම පැහැර හැර තිබීම;

(ඊ) මුදල් ණයට දෙන්නා විසින්, බලපත්‍රය නිකුත් කළ දින සිට මාස නවයක් තුළ ව්‍යාපාරය ආරම්භ කිරීමට අපොහොසත්ව තිබීම;

(උ) මුදල් ණයට දීමේ ව්‍යාපාරය ඈවර කරනු ලැබීම හෝ ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඌ) මුදල් ණයට දෙන්නා විසින් මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යාම නතර කර තිබීම;

(එ) මුදල් ණයට දෙන්නා විසින් ස්වකීය ණය හිමියන්ගේ සහ වෙනත් යම් පරදු දරන්නන්ගේ යහපතට හානිකර වූ ආකාරයකින් ස්වකීය ව්‍යාපාරය කරගෙන යනු ලැබීම; හෝ

(ඒ) මේ පනතේ 40 වන වගන්තියේ දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත්-

(i) ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකු;

(ii) යම් ධුර දරන නිලධරයකු; හෝ

(iii) යම් හවුල්කරුවකු,

මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ යෙදී සිටීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර මුදල් ණයට දෙන්නකු වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට පෙර, එකී මුදල් ණයට දෙන්නා වෙත ඒ පිළිබඳ ලිඛිත දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) එකී දැන්වීම ලැබුණු දින සිට දින දහහතරක් තුළ, මුදල් ණයට දෙන්නා විසින්, ස්වකීය බලපත්‍රය අවලංගු කරනු නොලැබිය යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් අධිකාරිය වෙත ප්‍රමාණවත් හේතු දක්වනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ මුදල් ණයට දෙන්නා විසින් දක්වන ලද හේතු සලකා බැලීමෙන් පසු, අධිකාරිය විසින් දැන්වීම නිකුත් කළ දින සිට දින අනූවක් තුළ-

(අ) එම දැන්වීම ඉවත් කර ගැනීම; හෝ

(ආ) මුදල් ණයට දෙන්නා වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම,

කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, එම අවලංගු කිරීම සම්බන්ධයෙන් වහාම අදාළ මුදල් ණයට දෙන්නා වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, එකී බලපත්‍රය අවලංගු කිරීම, එකී අවලංගු කිරීම සිදු කළ දින සිට හෝ අධිකාරිය විසින් උචිත යයි සලකනු ලැබිය හැකි යම් පසු දිනක සිට බලාත්මක විය යුතු ය. අධිකාරිය විසින්, එම අවලංගු කිරීම

පිළිබඳ දැන්වීමක්, යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාව තුළ සංසරණය වන එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පතකවත් පළ කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් ස්වේච්ඡාවෙන් අවලංගු කිරීම

**29.** (1) මුදල් ණයට දෙන්නකු විසින්, ඕනෑම අවස්ථාවක දී, ඔහු වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන ලෙස අධිකාරියෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් එකී ඉල්ලීම සලකා බලනු ලැබිය යුතු අතර, එකී මුදල් ණයට දෙන්නාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කිසිදු හේතුවක් නොමැති නම්, එකී බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ විට දී මුදල් ණයට දෙන්නා විසින් එකී බලපත්‍රය භාරදිය යුතු බව

**30.** (1) 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 29 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් බලපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක, මුදල් ණයට දෙන්නා විසින් වහාම අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත එකී බලපත්‍රය භාර දෙනු ලැබිය යුතු අතර, ස්වකීය ව්‍යාපාර ස්ථානයේ ඇති, එකී මුදල් ණයට දෙන්නා, බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු යයි ප්‍රචාරණය කරන්නා වූ යම් දේ මුදල් ණයට දෙන්නා විසින් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) 27 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන බලපත්‍රයක් අවලංගු කිරීම මගින්, එම ප්‍රතික්ෂේප කිරීමට හෝ අවලංගු කිරීමට පෙර ඇති කර ගන්නා ලද යම් මුදල් ණයට දීමේ ගිවිසුමකට බලපෑමක් නොවිය යුතු අතර, බලපත්‍රයේ කාලසීමාව තුළ ප්‍රදානය කරන ලද යම් ණයක් එකී මුදල් ණයට දෙන්නා විසින් ආපසු අයකර ගැනීමට ද එමගින් බලපෑමක් ඇති නොවිය යුතු ය.

(3) අධිකාරිය විසින්, 27 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ 28 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම මගින් මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එම මුදල් ණයට දෙන්නාට විරුද්ධව යම් නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාමට බලපෑමක් හෝ අගතියක් නොවිය යුතු ය.

**මුදල් ණයට දෙන්නකු විසින් කරගෙන යනු ලැබිය හැකි ව්‍යාපාර වර්ග**

**31.** මුදල් ණයට දෙන්නකු විසින්, මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවනු ලැබිය හැකි නැතහොත් එම මුදල් ණයට දෙන්නා වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසිවලට යටත්ව, යම් ව්‍යාපාර වර්ග කරගෙන යනු ලැබිය හැකි ය.

## V වන කොටස

### ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය

**බලපත්‍රලත් තැනැත්තන් විසින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර කරගෙන යා යුතු බව**

**32.** (1) මේ පනත යටතේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රලත් තැනැත්තකු හැර, වෙනත් කිසිම තැනැත්තකු විසින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) වලංගු බලපත්‍රයක් නොමැතිව ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යන හෝ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යන බවට යම් ආකාරයකින් ප්‍රචාරණය කරන හෝ ප්‍රසිද්ධ කරන හෝ පෙනී සිටින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) යම් තැනැත්තකු මේ පනත යටතේ බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු වන්නේ නම් ද-

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, 2007 අංක 07 දරන සමාගම් පනතේ අර්ථානුකූලව ඇපයෙන් සීමිත සමාගමක්, පෞද්ගලික සමාගමක්, අක්වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් නොවන්නා වූ ද, යම් සමාගමක් වන; හෝ

(ආ) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනත යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත්තා වූ ද, යම් රාජ්‍ය නොවන සංවිධානයක් වන,

තැනැත්තකු වන්නේ නම් ද මිස, එකී තැනැත්තා ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් ලෙස බලපත්‍රයක් ලැබීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු විසින්, ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එකී ඉල්ලීම, තත්කාර්ය සඳහා සාදනු ලබන රීතිවල දක්වා ඇති යම් ලේඛන හෝ තොරතුරු ද සමඟ එකී ආකෘති පත්‍රයට අනුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) 22 වන වගන්තියේ (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති සහ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (4) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් පිරිසැකසීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) අධිකාරිය විසින්, මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යනු ලැබූ කාලසීමාව තුළ දී ඉල්ලුම්කරුගේ අතීත හැසිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් දක්වා ඇති හේතු, මේ පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති කරුණු සහ එහි මතය අනුව පරීක්ෂණයක් සිදු කිරීමට හේතු වන්නා වූ වෙනත් කරුණු සැලකිල්ලට ගනිමින්-

(අ) අධිකාරිය විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත්ව, ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කිරීම; හෝ

(ආ) අධිකාරිය විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි පරිදි 27 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කරනු ලැබිය හැකි ය.

(7) බලපත්‍රයක් වසර තුනක කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු අතර, බලපත්‍රයේ කාලසීමාව තුළ ඕනෑම විටක දී, අධිකාරිය විසින් බලපත්‍රයේ කොන්දේසි කිසිවකට යමක් එකතු කිරීම, එම කොන්දේසි අහෝසි කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(8) ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන බලපත්‍රයක් මුදල් ණයට දෙන්නකු වෙත නිකුත් කරනු ලැබූ විට, 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා එම මුදල් ණයට දෙන්නා වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම මුදල් ණයට දෙන්නා විසින් -

(අ) මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රය වහාම අධිකාරිය වෙත භාර දෙනු ලැබිය යුතු අතර, එම බලපත්‍රය හෝ එහි පිටපතක් එහි ව්‍යාපාර ස්ථාන කිසිවක් තුළ ප්‍රදර්ශනය කරනු නොලැබිය යුතු ය; සහ

(ආ) සෑම විටකදී ම, (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ද එම බලපත්‍රයේ පිටපතක් අනෙකුත් සියලු ව්‍යාපාර ස්ථානවල ද පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(9) 24 වන වගන්තියේ, 25 වන වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඉ) ඡේදවල, 26 වන වගන්තියේ, 27 වන වගන්තියේ, 28 වන වගන්තියේ, 29 වන වගන්තියේ සහ 30 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (මෙහි මින් මතු "ක්ෂුද්‍රමූල්‍ය ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) (3) වන උපවගන්තියේ සඳහන් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:

එසේවුව ද, බලපත්‍රයක් වසර තුනක කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.

(10) යම් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් විසින්, මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ පනවනු ලැබිය හැකි නැතහොත් එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනය වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසිවලට යටත්ව, මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති යම් ව්‍යාපාර වර්ගයක් කරගෙන යනු ලැබිය හැකි ය.

(11) පහත දැක්වෙන පනත්වල විධිවිධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් සඳහා අදාළ නොවිය යුතු අතර, ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් විසින්, තත්කාර්යය සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව, එම ව්‍යාපාරය කරගෙන යනු ලැබිය යුතු ය:-

(අ) ණය ගැනුම්කරුවන් වෙත ක්ෂුද්‍ර ණය රක්ෂණය ලබා දීමේ කාර්යය සඳහා පමණක් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත; සහ

(ආ) ණය ගැනුම්කරුවන් වෙත ක්ෂුද්‍ර කල්බදු පහසුකම් ලබා දීමේ කාර්යය සඳහා පමණක්, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත.

ක්ෂුද්‍රමූල්‍ය ආයතන සඳහා වන විශේෂ විධාන

**33.** (1) අධිකාරිය විසින්, 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව සහ නිසි විමසීම් සිදුකිරීමෙන් පසු-

(අ) එම ක්ෂුද්‍රමූල්‍ය ආයතනය විසින් සමපාර්ශ්වීය ඇපය ලෙස තැන්පතු භාරගනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසි, එම තැන්පතු සඳහා ගෙවිය යුතු උපරිම පොලී අනුපාතික, තැන්පතු භාර ගනු ලැබිය හැකි උපරිම කාලසීමාව සහ ගනුදෙනුකරුවකු විසින් ආයතනයක තැන්පත් කරනු ලැබිය හැකි උපරිම මුදල් ප්‍රමාණය;

(ආ) ආයෝජන කරනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසි සහ එම ආයෝජන සඳහා අවසර දිය හැකි උපරිම කල්පිරීම්;

(ඇ) සංචිත අරමුදලක් පිහිටුවීම, බදු ගෙවීමෙන් පසු ඉතිරි වන වාර්ෂික ලාභයෙන් එම අරමුදලට මාරු කළ යුතු අවම ප්‍රතිශතය සහ එම අරමුදලේ වෙනත් මෙහෙයුම් අංග;

(ඈ) අවම ප්‍රාග්ධන අවශ්‍යතාව; සහ

(ඉ) ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් විසින් අඩු ආදායම්ලාභී තැනැත්තන් සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යවසායකයන් වෙත ප්‍රදානය කරන ලද නොගෙවා ඇති මූල්‍ය පහසුකම් එම ක්ෂුද්‍රමූල්‍ය ආයතනය විසින් ප්‍රදානය කරන ලද සම්පූර්ණ නොගෙවා ඇති මූල්‍ය පහසුකම්වලට දරනු ලබන අවම අනුපාතිකය,

සම්බන්ධයෙන් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලට හෝ යම් තනි ක්ෂුද්‍රමූල්‍ය ආයතනයකට හෝ යම් ක්ෂුද්‍රමූල්‍ය ආයතන කණ්ඩායමකට හෝ වර්ගයකට විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් විසින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද, රුපියල් මිලියන දෙකක් නොඉක්මවන්නා වූ ද, පරිපාලන ගාස්තුවක් ගෙවීමට අවශ්‍ය කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විධාන නිකුත් කරනු ලබන අවස්ථාවක, වත්කම්වල ප්‍රමාණය, බැරකම්, වෙළෙඳපොළ කොටස සහ වෙළෙඳපොළ තත්ත්වයන් ඇතුළු අදාළ කරුණු සැලකිල්ලට ගැනීමේ දී එම විධානය අදාළ ක්ෂුද්‍රමූල්‍ය ආයතනයට සමානුපාතික බවට අධිකාරිය විසින් වගබලාගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අධිකාරිය විසින්, එම නිර්දේශකයේ සමානුපාතිකතාව ඇගයීමේදී, විෂයබද්ධ සහ සත්‍යාපනීය උපමානයක් අදාළ කරගනු ලැබිය යුතු ය.

VI වන කොටස

## මුදල් ණයට දෙන්නන් සහ ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය කිරීම

නියාමන අනුමතය

**34.** (1) (මෙහි මින් මතු “බලපත්‍රලාභියා” යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් ණයට දීමේ ව්‍යාපාරය හෝ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු ලබන යම් තැනැත්තකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමතයෙන් තොරව,-

(අ) අලුත් ව්‍යාපාර ස්ථානයක් ආරම්භ කිරීම;

(ආ) කොමිස් වෙළෙඳාම හෝ වෙනත් යම් සමාන වැඩපිළිවෙළක් මාර්ගයෙන් ණය එකතු කිරීම ද ඇතුළුව එහි ණය එකතු කිරීමේ කර්තව්‍යය බාහිරින් සපයා ගැනීම;

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට,-

(i) පාලිත සමාගමක් පිහිටුවීම;

(ii) එහි සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම;

(iii) අධ්‍යක්ෂ මණ්ඩලයට අලුත් සාමාජිකයන් පත් කිරීම; හෝ

(iv) එහි ප්‍රාග්ධනය අඩු කිරීම;

(ඇ) සමිතියක් සම්බන්ධයෙන් වන විට, ධුර දරන නිලධරයන් වෙනස් කිරීම; හෝ

(ඉ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, හවුල්කරුවකු වෙනස් කිරීම,

කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කර ඇති පරිදි අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීමට අපොහොසත් වන යම් බලපත්‍රලාභියකු විසින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද, රුපියල් මිලියන දෙකක් නොඉක්මවන්නා වූ ද, මුදල් ප්‍රමාණයක් පරිපාලන ගාස්තුවක් ලෙස ගෙවීමට අවශ්‍ය කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, (1) වන උපවගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කරන විට දී, බලපත්‍රලාභියා වෙත නිර්දේශන නිකුත් කරනු ලැබිය හැකි ය.

ඇතැම් සිද්ධීන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දැන්විය යුතු බව

**35.** සියලු බලපත්‍රලාභීන් විසින්, පහත දැක්වෙන සිද්ධීන් නොපමාව ලිඛිතව අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය:-

(අ) එහි වගකීම් පියවීමට නොහැකි වීම හෝ බුන්වත්භාවයට පත්වීමට ආසන්නව සිටීම;

(ආ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, බලපත්‍රලාභියා ඈවර කිරීම සම්බන්ධයෙන් අධිකරණයේ යම් නඩුවක් පවරා තිබීම;

(ඇ) බලපත්‍රලාභියකු විසින් බංකොලොත්භාවය සම්බන්ධයෙන් අධිකරණයක යම් නඩුවක් පැවරීම;

(ඈ) සමිතියක් සම්බන්ධයෙන් වන විට, එය විසුරුවා හැරීම හෝ ගණන් බේරා වසා දැමීම; හෝ

(ඉ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, එය විසුරුවා හැරීම.

ඇවර කිරීමේ දී, විසුරුවා හැරීමේ දී හෝ ගණන් බේරා වසා දැමීමේ දී පනත දිගට ම අදාළ විය යුතු බව

**36.** අවස්ථාවෝචිත පරිදි, සමාගමක, හවුල් ව්‍යාපාරයක හෝ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය, හවුල්කරුවන් හෝ ධුර දරන නිලධරයන්, ඇවර කිරීමේ, විසුරුවා හැරීමේ හෝ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය අතරතුර, අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි, මේ පනත යටතේ සාදනු ලබන යම් නියමයක විධිවිධානවලට, යම් රීතියකට, තීරණයකට, නිර්දේශනයකට හෝ විධානයකට දිගට ම යටත් විය යුතු ය.

බලපත්‍රලාභීන් සඳහාවන විධාන

**37.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 33 වන වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතලවලට අමතරව, බලපත්‍රලාභීන් නිසි පරිදි විමසීමෙන් පසු, අධිකාරිය විසින්, එම බලපත්‍රලාභීන්ගේ ව්‍යාපාරික සහ ආයතනික කටයුතුවල යම් අංගයක් සිදු කරනු ලැබිය යුතු ආකාරය සහ විශේෂයෙන් ම පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විධාන නිකුත් කරනු ලැබිය යුතු ය:-

(අ) කොමිස් මුදල්, වට්ටම්, ගාස්තු, දඩ හෝ වෙනත් කවර වූ හෝ ලැබීම් හෝ ගෙවීම් ආකාරයෙන් අයකරනු ලැබිය හැකි උපරිම පොලී අනුපාතික හෝ ප්‍රමාණ;

(ආ) ණය හෝ වෙනත් යම් මූල්‍ය පහසුකම් මත අයකරනු ලබන පොලිය සහ එම ණය හෝ වෙනත් මූල්‍ය පහසුකම් මත අයකරනු ලබන උපරිම පොලී අනුපාතික ගණනය කරනු ලබන ක්‍රමවේදය සහ ආකාරය;

(ඇ) කොමිස් වෙළෙඳාම හෝ වෙනත් යම් සමාන වැඩපිළිවෙළක් මාර්ගයෙන් ණය එකතු කිරීම ද ඇතුළුව, ණය එකතු කිරීම;

(ඈ) විවිධ ණය වර්ග හෝ වෙනත් යම් මූල්‍ය පහසුකම් වර්ගයක් සඳහා අවශ්‍ය විය හැකි නැතහොත් අවසර දිය හැකි ඇපයේ ස්වභාවය සහ ප්‍රමාණය;

(ඉ) පවත්වාගෙන යා යුතු අවම ප්‍රාග්ධන හෝ ශුද්ධ වත්කම් ප්‍රමාණය;

(ඊ) සම්මත කර ගත යුතු අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හෝ ආයතනික පාලන මූලධර්ම;

(උ) පාලන සංග්‍රහයක් සහ චර්යා සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම;

(ඌ) (i) සමාගමක් සම්බන්ධයෙන් වන විට, එහි අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ සහ කොටස් හිමියන්ගේ;

(ii) සමිතියක් සම්බන්ධයෙන් වන විට, එහි ධුර දරන නිලධරයන්ගේ; හෝ

(iii) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, එහි හවුල්කරුවන්ගේ,

සුදුසුකම් සහ යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක;

(එ) ආයතනික සහ ව්‍යාපාරික කටයුතුවල ව්‍යුහාත්මක වෙනස් කිරීම් සම්බන්ධයෙන් වන සීමා කිරීම්;

(ඒ) පොත්පත් සහ ගිණුම් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යා යුතු ආකෘතිය සහ ආකාරය;

(ඔ) ගනුදෙනුකරුවන්ට තොරතුරු හෙළිදරව් කිරීමේ ආකෘතිය සහ ආකාරය;

(ඕ) ණය, ණය ආපසු අයකර ගැනීම්, අලෙවිකරණය, පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම්, ගනුදෙනුකාර සේවාවල සහ ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීම ඇතුළත් වන වෙනත් යම් කටයුත්තක යෙදී සිටින, බලපත්‍රලාභීන්ගේ සේවානියුක්තයන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය නිපුණතාව සම්බන්ධයෙන් වන අවම අවශ්‍යතා;

(ක) යම් ණය ගැනුම්කරුවකුගේ සමස්ත ආදායමට එකී ණය ගැනුම්කරුගේ සමස්ත ණය දරනු ලැබිය යුතු උපරිම අනුපාතිකය;

(ග) යම් දත්තයක්, තොරතුරක්, ණය ශ්‍රේණිගත කිරීම ඇතුළුව වාර්තාවක්, මූල්‍ය ප්‍රකාශ, වෙළෙඳ දැන්වීම් හෝ වෙනත් යම් අලෙවිකරණ ද්‍රව්‍යයක් යම් මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක පළ කිරීම;

(ච) වැඩකරන වේලාවන්, අනුයෝජිතයන් සහ නියෝජිතයන් භාවිත කිරීම, ණය ආපසු අය කර ගැනීමේ පිළිවෙත් සහ සන්නිවේදන ක්‍රම ඇතුළුව වෙළෙඳපොළ හැසිරීම නියාමනය කිරීම;

(ජ) උපදේශන සහ උපදේශක සේවා සැපයීම සඳහා ණය උපදේශන මධ්‍යස්ථාන පිහිටුවීම;

(ට) ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම; සහ

(ඩ) යම් ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් භාවිත කරමින් සිදු කරනු ලබන මුදල් ණයට දීමේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර නියාමනය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් බලපත්‍රලාභියකු විසින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද රුපියල් මිලියන දෙකක්, නොඉක්මවන්නා වූ ද, මුදල් ප්‍රමාණයක්, පරිපාලන ගාස්තුවක් ලෙස ගෙවීමට අවශ්‍ය වන්නේ ය.

(3) අදාළ බලපත්‍රලාභීන් නිසි පරිදි විමසීමෙන් පසු, අධිකාරිය විසින් යම් බලපත්‍රලාභියකුගේ පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වෙත එකී සමාගමේ, ව්‍යාපාරයේ යම් අංගයක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන, යම් මූල්‍ය ක්ෂේත්‍ර නියාමන අධිකාරියක නියාමනයට යටත් පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් සඳහා අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින්නා වූ යම් බලපත්‍රලාභියකුගේ පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් විසින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වූ ද, රුපියල් මිලියන දෙකක් නොඉක්මවන්නා වූ ද, මුදල් ප්‍රමාණයක් පරිපාලන ගාස්තුවක් ලෙස ගෙවීමට අවශ්‍ය වන්නේ ය.

(5) (1) වන සහ (3) වන උපවගන්ති යටතේ විධාන නිකුත් කරනු ලබන අවස්ථාවක, වත්කම්වල ප්‍රමාණය, බැරකම්, වෙළෙඳපොළ කොටස සහ වෙළෙඳපොළ තත්ත්වයන් ඇතුළු අදාළ කරුණු අනුව එකී විධානය අදාළ බලපත්‍රලාභියාට හෝ බලපත්‍රලාභියාගේ පාලක සමාගමට, යම් පාලිත සමාගමකට හෝ ආශ්‍රිත සමාගමකට සමානුපාතික බවට අධිකාරිය විසින් වගබලාගනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් රීති සෑදිය හැකි බව හෝ විධාන නිකුත් කළ හැකි බව

**38.** (1) අධිකාරිය විසින්, කලින් කල -

(අ) පහත දැක්වෙන කරුණු ඇතුළුව, මේ පනත යටතේ අධිකාරියේ හෝ එහි නිලධරයන් කිසිවකුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට බලපාන හෝ සම්බන්ධ හෝ ආනුෂංගික යම් කරුණක් සම්බන්ධයෙන් එය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් රීති සාදනු ලැබිය හැකි ය:-

(i) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම;

(ii) සේවානියුක්තයන්ගේ පත්වීම්, උසස්වීම්, පාරිශ්‍රමික සහ විනය පාලනය සහ එකී සේවා නියුක්තයන් සඳහා නිවාඩු සහ වෙනත් පාරිශ්‍රමික ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය;

(iii) අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සේවා නියම සහ කොන්දේසි;

(iv) අධිකාරියේ අරමුදලෙන් මුදල් ගෙවීම;

(v) අධිකාරිය විසින් සපයන ලද යම් සේවාවක් සඳහා අයකිරීම් සිදු කිරීම හෝ ගාස්තු අයකිරීම;

(vi) මේ පනත යටතේ බලපත්‍ර දීම සඳහා වන නිර්ණායක;

(vii) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් සඳහා වන පිරිසැකසුම් ගාස්තුව;

(viii) බලපත්‍රලාභියකු විසින් අධිකාරියට ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව;

(ix) මේ පනතේ කාර්ය සඳහා භාවිත කළ යුතු ආකෘති පත්‍ර, ලේඛන හෝ තොරතුරු;

(x) 51 වන වගන්තිය යටතේ පරීක්ෂණ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය;

(xi) මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම; සහ

(xii) අධිකාරියේ කටයුතු හා සම්බන්ධ වෙනත් යම් කරුණක්; හෝ

(ආ) එවැනි යම් විධාන නිකුත් කිරීම.

(2) (v) වන, (vi) වන, (vii) වන, (viii) වන සහ (x) වන ඡේද යටතේ රීති සාදනු ලබන අවස්ථාවක, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන අදාළ කරුණු අනුව එම රීතිය අදාළ බලපත්‍රලාභියාට සමානුපාතික වන බවට අධිකාරිය විසින් වගබලා ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අධිකාරිය විසින්, එම විධානයේ සමානුපාතිකතාව ඇගයීමේ දී, විෂයබද්ධ සහ සත්‍යාපනීය උපමානයක් අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදනු ලබන සෑම විධානයක් ම හෝ රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය එම අනුමතයෙන් පසු බලාත්මක විය යුතුය.

(4) පාර්ලිමේන්තුව විසින් එම විධානය හෝ රීතිය අනුමත කරනු ලැබූ දිනය නිශ්චිතව දැක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**39**. (1) බලපත්‍රලාභියකු - නියාමන ක්‍රියාමාර්ග

(අ) එහි ණය හිමියන්ගේ සහ අනෙකුත් පරදූ දරන්නන්ගේ යහපතට හානිකර වූ, අයහපත් හෝ අනිසි මූල්‍ය පිළිවෙත් අනුගමනය කරමින් සිය ව්‍යාපාරය කරගෙන යන බව නැතහොත් එවැනි පිළිවෙත් අනුගමනය කරමින් සිය ව්‍යාපාරය කරගෙන යාමේ ක්‍රියාවලියක නිරත වන බව; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද යම් නිර්දේශනයක්, විධානයක්, රීතියක්, නියමයක්, හෝ නියම කිරීමක් උල්ලංඝනය කර ඇති බව නැතහොත් ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති බව,

අධිකාරියේ මතය වන අවස්ථාවක, අධිකාරිය විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි සංඛ්‍යාවක් ගනු ලැබිය යුතු ය:-

(i) එම පිළිවෙත නතර කරන ලෙස එම බලපත්‍රලාභියාට විධාන කිරීම;

(ii) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද නිර්දේශනයකට, විධානයකට, රීතියකට, නියමයකට හෝ නියම කිරීමකට අනුකූලව කටයුතු කිරීම එම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති විට, වහාම හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ ඊට අනුකූලව කටයුතු කරන ලෙස එම බලපත්‍රලාභියාට විධාන කිරීම;

(iii) එම පිළිවෙතෙන් හෝ උල්ලංඝනය කිරීමෙන් ඇති වන ඍණාත්මක බලපෑම් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම බලපත්‍රලාභියාට විධාන කිරීම;

(iv) බලපත්‍රලාභියාගේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, සේවානියුක්තයකු, හවුල්කරුවකු, ධුර දරන්නකු හෝ පාලකවරයකු බලපත්‍රලාභියාගේ හෝ බලපත්‍රලාභියාට අදාළ යම් කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමෙන් වැළැක්වීම;

(v) බලපත්‍රලාභියාගේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, හවුල්කරුවකු, ධුර දරන්නකු හෝ සේවානියුක්තයකු ඉවත් කිරීම;

(vi) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා මත හෝ බලපත්‍රලාභියාගේ අධ්‍යක්ෂ

මණ්ඩලයේ යම් සාමාජිකයකු, කළමනාකරුවකු, සේවානියුක්තයකු, හවුල්කරුවකු හෝ ධුර දරන්නකු මත රුපියල් මිලියන දෙකක් නොඉක්මවන පරිපාලන ගාස්තුවක් පැනවීම;

(vii) ගනුදෙනුකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් බලපත්‍රලාභියා සමඟ එළඹ ඇති යම් ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් සමාලෝචනය කිරීම සහ ණය ගැනුම්කරුවන්ගේ හෝ වෙනත් යම් පරදූ දරන්නන්ගේ සම්බන්ධතා හෝ විචක්ෂණශීලී වාණිජ පිළිවෙත් සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දැක්වීමෙන් තොරව, එකී ගිවිසුමට හෝ කොන්ත්‍රාත්තුවට එළඹ ඇතැයි අධිකාරිය විසින් සලකනු ලබන අවස්ථාවක, මුදල් ආපසු ගෙවීමට, පොලී අනුපාතිකවලට සහ ගාස්තුවලට අදාළ නියම ඇතුළුව, එම කොන්ත්‍රාත්තුවේ නියම වෙනස් කිරීම; හෝ

(viii) අධිකාරියට දැඩි අධීක්ෂණ සැලකිල්ලක් ඇත්තේ යම් මුදල් ණයට දෙන්නකු හෝ ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් සම්බන්ධයෙන් ද එවැනි දැඩි අධීක්ෂණ සැලකිල්ලක් ඇති මුදල් ණයට දෙන්නකු හෝ ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් ලෙස බලපත්‍රලාභියාගේ නම පළ කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ ගනු ලැබූ යම් ක්‍රියාමාර්ගයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම ක්‍රියාමාර්ගය ගනු ලැබූ දින සිට දින දහහතරක් ඉකුත් වීමට පෙර අධිකාරිය වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින්, එම අභියාචනය ලැබුණු දින සිට දින අනූවක් තුළ ස්වකීය තීරණය ලබා දිය යුතු ය.

ධුර දැරීමට නුසුදුසුකම්

**40.** යම් තැනැත්තකු -

(අ) වරදකට වරදකරු කරනු ලැබූ නැතහොත් වංචාව, රැවටීම, වංකභාවය හෝ වෙනත් යම් අනිසි හැසිරීමක් සම්බන්ධයෙන් වන යම් අපරාධ නඩු කටයුත්තකට යටත් තැනැත්තකු වේ නම්;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණයක් විසින් නිදහස් නොකළ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඇ) මූල්‍ය අවපාලනය සහ චරිත දූෂණය සම්බන්ධයෙන් වන වරදකට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඈ) මේ පනත යටතේ හෝ 1988 අංක 30 දරන බැංකු පනත, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ වන යම් වරදකට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඉ) වංචාව, රැවටීම, වංකභාවය සම්බන්ධයෙන් වන ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චයාධිකාරයක් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් විසින් යම් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට යටත් කොට ඇත්නම්;

(ඊ) යම් පත් කිරීමට හෝ තෝරා පත් කිරීමට පෙරාතුව ඕනෑම විටක දී, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චයාධිකාරයක් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් විසින් වංචාව, රැවටීම, වංකභාවය සම්බන්ධයෙන් වන ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු යයි තීරණය කරනු ලැබ ඇත්නම්;

(උ) නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක, මූල්‍ය සමාගමක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරයකු ලෙස සේවය කිරීමෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් හෝ එසේ සේවය කිරීම අත්හිටුවනු ලැබ ඇත්නම්;

(ඌ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක්, මූල්‍ය සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින්, වංචාව, රැවටීම, වංකභාවය හෝ වෙනත් සමාන සාපරාධී වරදක් හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක, මූල්‍ය සමාගමක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරයකු ලෙස සේවය කිරීමෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් හෝ එසේ සේවය කිරීම අත්හිටවනු ලැබ ඇත්නම්;

(එ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින්, සිහිවිකල් තැනැත්තකු බවට, ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඒ) බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති බලපත්‍රලාභී බැංකුවක, බලපත්‍රලත් මූල්‍ය සමාගමක හෝ

යම් ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක හෝ යම් බලපත්‍රලත් රක්ෂණ සමාගමක ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකුව සිට ඇත්නම්;

(ඔ) මහ බැංකුව විසින්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 2 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට තීරණය කර ඇත්තා වූ ද, නැතහොත් 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ඒ හා සමාන තීරණයක් ලබා දී ඇත්තා වූ ද, යම් සංස්ථාපිත මණ්ඩලයක හෝ යම් සංස්ථාපිත නොවන මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකුව සිට ඇත්නම් නැතහොත් වෙනත් බලයලත් නිලයක් දරනු ලැබ ඇත්නම්;

(ඕ) අධිකාරිය විසින්, බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති, බලපත්‍රලාභියකුගේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකු, ධුර දරන්නකු හෝ හවුල්කරුවකුව සිට ඇත්නම්; හෝ

(ක) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණයක් විසින් ලබා දුන් නඩු තීන්දුවකට හෝ නියෝගයකට අනුකූලව කටයුතු කිරීමට හෝ ණයක් ආපසු ගෙවීම පැහැර හැර ඇත්නම්,

එකී තැනැත්තා, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියකුගේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකු, හවුල්කරුවකු හෝ ධුර දරන්නකු ලෙස පත් කිරීමට හෝ තෝරා පත් කිරීමට නැතහොත් එම තනතුර දැරීමට නුසුදුස්සකු විය යුතු ය.

VII වන කොටස

## බලපත්‍රලාභියකු පරීක්ෂා කිරීම

*බලපත්‍රලාභීන් විසින් ලේඛන හෝ තොරතුරු සැපයිය යුතු බව*

**41.** (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, බලපත්‍රලාභියකුගේ ව්‍යාපාරික සහ ආයතනික කටයුතු සිදු කරනු ලබන ආකාරය නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් නිශ්චිතව දක්වා ඇති කාර්යයක් සඳහා, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කලින් කල නිශ්චිතව දක්වනු ලබන යම් ආකාරයකින් සහ ආකෘතියකින් ද යම් කාල පරතරයන් හි දී හෝ කාලසීමාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත හෝ තත්කාර්යය සඳහා නම් කරන ලද අධිකාරියේ යම් සේවා නියුක්තයකු වෙත අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් දක්වනු ලබන ආකාරයට සහ යම් කාලයක් ඇතුළත ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කරන ලෙස යම් බලපත්‍රලාභියකුට හෝ තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු විසින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද, රුපියල් මිලියන දෙකක් නොඉක්මවන්නා වූ ද, මුදල් ප්‍රමාණයක් පරිපාලන ගාස්තුවක් ලෙස ගෙවීමට අවශ්‍ය වන්නේ ය.

(3) මේ වගන්තියේ, "තැනැත්තා" යන්නට, රජයේ යම් දෙපාර්තමේන්තුවක හෝ යම් නීතියක් යටතේ හෝ අන්‍යාකාරයකින් පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද යම් සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක යම් නිලධරයකු ද ඇතුළත් වේ.

*බලපත්‍රලාභීන් පරීක්ෂා කිරීම*

**42.** (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද අධිකාරියේ යම් නිලධරයකු හෝ අධිකාරියේ අනුමතය ඇතිව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු විසින්, ඕනෑම විටක දී, යම් බලපත්‍රලාභියකුගේ ගිණුම් පොත් සහ වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය:-

(අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ යම් ආකාරයකට හෝ ආකෘතියකට අනුව, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සියලු තොරතුරු සපයන ලෙස, එම බලපත්‍රලාභියාගේ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස සහ නියම කරනු ලබන යම් ආකෘතියකින් එම පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් ලේඛනවල සත්‍ය බවට සහතික කරන ලද පිටපත් සපයන ලෙස යම් බලපත්‍රලාභියකුට හෝ බලපත්‍රලාභියකුගේ අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයකුට, කළමනාකරුවකුට, සේවානියුක්තයකුට, විගණකවරයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවකුට, හවුල්කරුවකුට හෝ ධුර දරන්නකුට නියම කිරීම;

(ආ) එම බලපත්‍රලාභියාගේ හෝ එම බලපත්‍රලාභියාගේ යම් අධ්‍යක්ෂවරයකුගේ, ලේකම්වරයකුගේ, කළමනාකරුවකුගේ, සේවානියුක්තයකුගේ, විගණකවරයකුගේ, අනුයෝජිතයකුගේ, කොන්ත්‍රාත්කරුවකුගේ, හවුල්කරුවකුගේ, ධුර දරන්නකුගේ යම් පරිශ්‍රයකට හෝ ගබඩා ප්‍රදේශයකට හෝ යම් දේපළකට හෝ ඉහත නිශ්චිතව දක්වා නොමැති වෙනත් යම් ස්ථානයකට ඇතුළු වීම සහ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම බලපත්‍රලාභියාගේ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සහ එම පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් යම් ලේඛනවල සත්‍ය බවට සහතික කළ හෝ නොකළ ඕනෑම ආකාරයක පිටපත් ලබා ගැනීම;

(ඈ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද විගණකවරයකුට විගණනය කිරීම සඳහා එකී බලපත්‍රලාභියාගේ ගිණුම් ඉදිරිපත් කරන ලෙස, යම් තොරතුරු සපයන ලෙස සහ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පවත්වාගෙන යන යම් පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් යම් ලේඛන ඉදිරිපත් කරන ලෙස යම් බලපත්‍රලාභියකුට හෝ යම් බලපත්‍රලාභියකුගේ අධ්‍යක්ෂවරයකුට කළමනාකරුවකුට, සේවානියුක්තිකයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවකුට, හවුල්කරුවකුට, ධුර දරන්නකුට හෝ ලේකම්වරයකුට නියම කිරීම;

(ඇ) යම් බලපත්‍රලාභියකුගේ අධ්‍යක්ෂවරයකුගෙන්, කොටස්හිමියකුගෙන්, ලේකම්වරයකුගෙන්, කළමනාකරුවකුගෙන්, සේවානියුක්තිකයකුගෙන්, අනුයෝජිතයකුගෙන්, විගණකවරයකුගෙන්, හවුල්කරුවකුගෙන්, ධුරදරන්නකුගෙන් හෝ කොන්ත්‍රාත්කරුවකුගෙන් හෝ එම බලපත්‍රලාභියාගේ ව්‍යාපාරික හෝ ආයතනික කටයුතු පිළිබඳ පෞද්ගලිකව දැන සිටින හෝ ඒ පිළිබඳ දැනුමක් ඇති හෝ ඒ සම්බන්ධයෙන් තොරතුරු සන්තකයේ ඇති වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ ලිඛිත දැන්වීමක් මගින් තොරතුරු ඉල්ලා සිටීම, ප්‍රශ්න ඇසීම සහ ප්‍රකාශ වාර්තා කිරීම හෝ අවශ්‍ය නම්, තොරතුරු ඉදිරිපත් කරන ලෙස හෝ (17 වන අධිකාරය වූ) දිවුරුම් හෝ ප්‍රතිඥා ආඥාපනතට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා දෙන ලෙස විධාන කිරීම;

(ඉ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අවශ්‍ය යයි සලකනු ලබන තොරතුරු සපයන ලෙස සහ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පවත්වාගෙන යන ඒ අදාළ පාර්ශ්වයේ පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස සහ

නියම කරනු ලබන යම් ආකෘතියකින් එම පොත්, වාර්තා, ලිපිගොනු, නාමලේඛන සහ වෙනත් යම් ලේඛනවල සත්‍ය බවට සහතික කරන ලද පිටපත් සපයන ලෙස බලපත්‍රලාභියකුගේ අදාළ යම් පාර්ශ්වයකට නියම කිරීම;

මේ ඡේදයේ කාර්යය සඳහා ‟අදාළ පාර්ශ්වය" යන්නෙන්-

(i) සමාගමක් සම්බන්ධයෙන් වන විට, යම් බලපත්‍රලාභියකුගේ යම් පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් හෝ යම් බලපත්‍රලාභියකුගේ පාලක සමාගමේ යම් පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් හෝ යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකු, ලේකම්වරයකු හෝ ඔවුන්ගේ ළඟම ඥාතීන්;

(ii) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, හවුල්කරුවකු, යම් හවුල්කරුවකුගේ ළඟම ඥාතීන්;

(iii) සමිතියක් සම්බන්ධයෙන් වන විට, ධුර දරන්නකු හෝ යම් ධුර දරන්නකුගේ ළඟම ඥාතීන්; හෝ

(iv) අධ්‍යක්ෂ - ජනරාල්වරයාගේ මතය අනුව යම් බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් සැලකිය යුතු මූල්‍ය සම්බන්ධතාවක් හෝ වැදගත් කළමනාකාරිත්ව සම්බන්ධතාවක් දරන වෙනත් යම් බලපත්‍රලාභියකු හෝ පුද්ගලයකු අදහස් වේ; හෝ

(ඊ) එම පරීක්ෂණය අතරතුර එම බලපත්‍රලාභියාගේ කටයුතුවල සැබෑ තත්ත්වය නිශ්චය කර ගැනීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන වෙනත් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම.

(2) අධිකාරිය විසින්, අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, එකී බලපත්‍රලාභියාගේ කටයුතුවල සැබෑ තත්ත්වය නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා යම් බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු සලස්වන ලෙස අධ්‍යක්ෂ-ජනරාල්වරයාට විධාන කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, (1) වන සහ (2) වන උපවගන්ති ප්‍රකාර පවත්වනු ලබන පරීක්ෂණයක් අවසන් වීමෙන් පසු, එම පරීක්ෂණය සම්බන්ධයෙන් අධිකාරිය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් නිර්දේශනයකට, විධානයකට, රීතියකට, නියමයකට හෝ තීරණයකට අනුකූලව කටයුතු කිරීම බලපත්‍රලාභියකු විසින් පැහැර හැර ඇති බවට, 41 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලැබුණු ලේඛන සහ තොරතුරු මාර්ගයෙන් හෝ වෙනත් කවර වූ හෝ ආකාරයකින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින්, ඒ බව අධිකාරිය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(5) (3) වන හෝ (4) වන උපවගන්ති යටතේ වාර්තාවක් ලැබුණු පසු, අධිකාරිය විසින්, 39 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියාමන ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය.

මේ කොටස යටතේ පනවන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කිරීමේ කාර්යය

**43.** මේ කොටස යටතේ යම් තැනැත්තකු වෙත පනවන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කිරීම ඒ සෑම තැනැත්තකුගේ ම කාර්යය විය යුතු අතර -

(අ) මේ කොටස යටතේ අවශ්‍ය කරන ලද යම් තොරතුරක් සැපයීම හෝ යම් පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, නාමලේඛනයක් හෝ වෙනත් යම් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම පැහැර හරින;

(ආ) සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳ වූ විට පුද්ගලිකව ම ඊට පැමිණීම පැහැර හරින;

(ඇ) ව්‍යාජ, අසම්පූර්ණ හෝ සාවද්‍ය හෝ නොමඟ යවන සුලු තොරතුරක්, පොතක්, වාර්තාවක්, ලිපිගොනුවක්, නාමලේඛනයක් හෝ වෙනත් යම් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් සපයන; හෝ

(ඈ) අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට බාධා කරන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන්නේ ය.

## VIII වන කොටස

### ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම

බැංකු ව්‍යාපාරයේ, මූල්‍ය ව්‍යාපාරයේ හෝ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ නොයෙදිය යුතු බව

**44**. කිසිම බලපත්‍රලාභියකු විසින්, එකී ව්‍යාපාරයේ අලෙවිකරණ කාර්යය සඳහා භාවිත කරන්නා වූ ද, එම බලපත්‍රලාභියා බැංකු ව්‍යාපාරය, මූල්‍ය ව්‍යාපාරය හෝ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යන බව මහජනයාට හඟවන හෝ ඒ බවට වූ අනුමතයක් ලබා දෙන යෙදුම් අන්තර්ගත වන්නා වූ ද, යම් වෙළෙඳ දැන්වීමක්, චක්‍රලේඛයක් හෝ වෙනත් යම් දෙයක් නිකුත් කිරීම, පළ කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, එකී ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ අලෙවිකරණ කාර්යය සඳහා භාවිත කරන යම් වෙළෙඳ දැන්වීමක්, චක්‍රලේඛයක් හෝ වෙනත් යම් දෙයක් නිකුත් කිරීම, පළ කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සඳහා මේ පනත යටතේ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් සඳහා මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම

**45.** සෑම බලපත්‍රලාභියකු විසින් ම, ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සහ වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කරනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය, හවුල්කරුවන් හෝ ධුර දරන්නන් විසින් එය අනුමත කරනු ලැබිය යුතු ය. තව ද, එම මාර්ගෝපදේශ බලපත්‍රලාභියාගේ සියලු සේවානියුක්තයන්ට සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

බලපත්‍රලාභියාගේ වගකීම්

**46**. බලපත්‍රලාභියකු විසින් -

(අ) ණයක් ප්‍රදානය කිරීමට පෙර, සියලු ගනුදෙනුකරුවන් සමග ලිඛිතව වූ ගිවිසුමකට එළඹීම;

(ආ) අධික ලෙස ණයගැතිභාවයට පත්වීම වැළැක්වීම පිණිස, ණය ප්‍රදානය කරනු ලබන්නේ යම් ගනුදෙනුකරුවන් වෙත ද, එම ගනුදෙනුකරුවන්ට එම ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති බවට වගබලා ගැනීම;

(ඇ) ගිවිසුමකට එළඹෙන අවස්ථාවේ දී, අය කරනු ලබන නාමික පොලී අනුපාතිකය සහ සඵල වාර්ෂික පොලී අනුපාතිකය නිශ්චිතව දැක්වීම;

(ඈ) යම් ගනුදෙනුකරුවකුගේ ඉල්ලීම මත, අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලබන ගාස්තුවකට යටත්ව ණය පිළිබඳ ප්‍රකාශයක් හෝ ගිණුම් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් එම ගනුදෙනුකරුවාට ලබා දීම; සහ

(ඉ) ස්වකීය ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සහ ගෞරවාන්විත ලෙස සලකන බවට වගබලා ගැනීම,

කරනු ලැබිය යුතු ය.

බාලවයස්කරුවකු සමග කිසිදු ගිවිසුමක් ඇති කර නොගත යුතු බව

**47.** බලපත්‍රලාභියකු විසින්, පූර්ණ වයසට එළඹ නොමැති තැනැත්තකුට ණයක් හෝ වෙනත් යම් මූල්‍ය සේවාවක් සැපයීම සඳහා වන කිසිදු ගිවිසුමක් ඇති කර ගනු නොලැබිය යුතු ය.

ණය ගිවිසුම

**48.** (1) ණයක් හෝ වෙනත් යම් මූල්‍ය සේවාවක් සැපයීම සඳහා බලපත්‍රලාභියකු විසින් ස්වකීය ගනුදෙනුකරුවන් සමග ඇති කර ගනු ලබන යම් ගිවිසුමක් -

(අ) සංක්ෂිප්ත විය යුතු ය, අවබෝධ කර ගැනීමට පහසු විය යුතු ය සහ නිරවද්‍ය විය යුතු ය;

(ආ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවන් අතරින් තමා කැමති භාෂාවකින් ගනුදෙනුකරුවාට ලබා ගැනීමට සැලැස්විය යුතු ය;

(ඇ) අසාධාරණ හෝ නොමඟ යවන සුලු විස්තර සපයන හෝ එම බලපත්‍රලාභියාගේ වගකීම බැහැර කරන්නා වූ හෝ සීමා කරන්නා වූ, ගනුදෙනුකරුවාගේ යම් අයිතිවාසිකමක් බැහැර කරන්නා වූ හෝ සීමා කරන්නා වූ හෝ තත්කාලයේ බලපවත්නා මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් නිර්දේශනයක්, විධානයක් හෝ රීතියක් හෝ යම් ලිඛිත නීතියක් අදාළ වීම වළක්වන්නා වූ යම් නියම සහ කොන්දේසි ඇතුළත් නොවිය යුතු ය;

(ඈ) ගනුදෙනුකරුවාට මුදල් ණයට දෙනු ලබන්නේ හෝ වෙනත් යම් මූල්‍ය සේවාවක් සපයනු ලබන්නේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම සියලු නියම සහ කොන්දේසි ඇතුළත් විය යුතු අතර, එම කොන්දේසිවලට කරනු ලබන යම් සංශෝධනයක් හෝ වෙනස් කිරීමක්, එම සංශෝධනය හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුවාට ලිඛිතව දැනුම් දුන් පසු ගනුදෙනුකරු ඊට ලිඛිතව එකඟතාව පළ කර ඇත්නම් මිස, අධිකරණයක් ඉදිරියෙහි බලාත්මක නොවිය යුතු ය; සහ

(ඉ) ගිවිසුමකට එළඹීමට පෙර, තමා කැමති භාෂාවකින් එහි අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රතීයමානයන් ගනුදෙනුකරුවාට පැහැදිලි කර දෙනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන යම් නිර්දේශනයක්, රීතියක්, විධානයක් හෝ තීරණයක් උල්ලංඝනය කරමින් ඇතුළත් වූ යම් ණය ගිවිසුමක් හෝ එම ණය ලබාගැනීම සඳහා වූ යම් ඇපකරයක් හෝ ඇපයක් ශූන්‍ය බලරහිත විය යුතු අතර එය යම් අධිකරණයක් ඉදිරියෙහි බලාත්මක කළ නොහැකි වන්නේ ය.

**49.** බලපත්‍රලාභියකු විසින්- බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් වන තහනම් ක්‍රියා

(අ) හිස්, අසම්පූර්ණ හෝ වෙනස් කළ ණය ගිවිසුමකට, වෙනත් යම් මූල්‍ය සේවාවක් සැපයීම සම්බන්ධයෙන් වන ගිවිසුමකට හෝ යම් ඇප ලියවිල්ලකට යම් තැනැත්තකුගේ කැමැත්ත හෝ අත්සන ලබා ගැනීම;

(ආ) යම් අවස්ථාවක දී ණයට දෙන ලද මුල් මුදල් ප්‍රමාණය ද ඉක්මවන මුළු මුදල් ප්‍රමාණයක්, පොලිය වශයෙන් ආපසු අයකර ගැනීම;

(ඇ) යම් ගනුදෙනුකරුවකුට යම් අසත්‍ය, නොමඟ යවන සුලු හෝ රවටන සුලු ප්‍රකාශයක් කිරීම හෝ ගනුදෙනුකරුවකුගෙන් යම් වැදගත් කරුණක් සැඟවීම;

(ඈ) ණය ගිවිසුමකට හෝ මූල්‍ය සේවා සැපයීම සඳහා වන වෙනත් යම් ගිවිසුමකට එළඹීමට හෝ යම් නියමයකට හෝ කොන්දේසියකට එකඟවීමට යම් තැනැත්තකු වංචනික ලෙස පෙලඹවීම හෝ පෙලඹවීමට තැත් කිරීම;

(ඉ) ආගම, ස්ත්‍රී පුරුෂභාවය හෝ ඒ සම්බන්ධ වෙනත් යම් වැදගත් සාධකයක් මත පදනම්ව යම් ජන කොට්ඨාසයකට වෙනස් කොට සැලකීම;

(ඊ) යම් තැනැත්තකුට මුදල් ණයට දීමේ දී හෝ එම තැනැත්තාගෙන් එම මුදල් ආපසු අයකර ගැනීමේ දී අයුතු බලපෑම් සිදු කිරීම; හෝ

(උ) එදිනෙදා ණය වාරික එකතු කිරීම සහ ණය ආපසු අයකර ගැනීම හෝ 33 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධාන මඟින් තහනම් කරන ලද යම් ක්‍රියාකාරකමක් සිදුකිරීමේ දී ගනුදෙනුකරුවන්ට සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ට හිංසන සිදුකිරීම, තර්ජනය කිරීම, බියගැන්වීම හෝ අවමන් කිරීම,

කරනු නොලැබිය යුතු ය.

ණය උපදේශන මධ්‍යස්ථාන

**50.** අධිකාරිය විසින්, එහි යම් ශාඛාවක හෝ අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් ස්ථානයක ණය උපදේශන මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය හැකි ය.

ගනුදෙනුකරුවන් විසින් අධිකාරිය වෙත කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

**51.** (1) බලපත්‍රලාභියකු වෙතින් පීඩාවට පත් ගනුදෙනුකරුවන් විසින් අධිකාරිය වෙත කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අධිකාරිය විසින්, (මෙහි මින් මතු "විමර්ශන නිලධරයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නිලධරයකු හෝ නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා,

(අ) බලපත්‍රලාභියකු, පැමිණිලිකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම සහ අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටීම;

(ආ) මේ පනතේ VII වන කොටස යටතේ පරීක්ෂණ පැවැත්වීම; හෝ

(ඇ) බලපත්‍රලාභියා හෝ පැමිණිලිකරු හෝ බලපත්‍රලාභියා සහ පැමිණිලිකරු යන දෙපාර්ශ්වය ම විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සඳහා කැඳවීම,

සඳහා අධිකාරියට බලය තිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා අධිකාරිය විසින් කැඳවනු ලබන යම් පාර්ශ්වකරුවකු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට නීතිඥවරයකුට හිමිකමක් හෝ අවසරයක් නොලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින්, (2) වන උපවගන්තිය යටතේ විමර්ශන පැවැත්වීම සඳහා, රීති මගින් නිශ්චිතව දක්වනු ලබන යම් උචිත කාර්යපටිපාටියක් සම්මත කර ගනු ලැබිය හැකි ය.

(5) පාර්ශ්වකරුවන් සමථයකට පත් කිරීමට විමර්ශන නිලධරයා විසින් ප්‍රයන්ත දරනු ලැබිය යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වූ අවස්ථාවක, එකී පාර්ශ්වකරුවන් විසින් අධිකාරිය වෙත කරන ලද කරුණු ඉදිරිපත් කිරීම් සහ විමර්ශන නිලධරයාගේ නිර්දේශ ද ඔහුගේ මතය අනුව විමර්ශනයක් පැවැත්වීමට සුදුසු වන්නා වූ වෙනත් යම් කරුණු ද සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් -

(අ) අධිකාරිය නියම කරනු ලබන ආකාරයට 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් ගැනීම;

(ආ) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා හෝ ගනුදෙනුකරුවා හෝ බලපත්‍රලාභියා සහ ගනුදෙනුකරුවා යන දෙපාර්ශ්වය ම වෙත නිර්දේශන නිකුත් කිරීම; හෝ

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේද යටතේ වන ක්‍රියා දෙක ම සිදු කිරීම,

කරනු ලැබිය හැකි ය.

(6) අධිකාරිය විසින්, ගනුදෙනුකරුවන්ගෙන් හෝ බලපත්‍රලාභීන්ගෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ දැනට පවතින ගැටලු සහ මතුවෙමින් පවතින ගැටලු, එම ගැටලුවල රටාවන්, එම ගැටලු පුනරාවර්තනය වීම සහ අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් සමාන කරුණු හඳුනා ගැනීම සඳහා එම පැමිණිලි විශ්ලේෂණය කරනු ලැබිය යුතු ය.

ගනුදෙනුකරුවන්ගේ නිසි උද්‍යෝගය පිළිබඳ නියමයන්

**52.** (1) ස්වකීය ව්‍යාපාරය කර ගෙන යාමේ දී, තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පනවන ලද ගනුදෙනුකරුවන්ගේ නිසි උද්‍යෝගය පිළිබඳ නියමයන්වල සියලු අංගවලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම සෑම බලපත්‍රලාභියකුගේ ම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරන ලද යම් නියෝගයක්, නිර්දේශනයක්, විධානයක්, රීතියක්, තීරණයක්, මාර්ගෝපදේශයක් හෝ චක්‍රලේඛයක් එකී සියලු බලපත්‍රලාභීන් සඳහා අදාළ විය යුතු ය.

ගනුදෙනුකරුවන්ගේ වගකීම්

**53.** ගනුදෙනුකරුවකු විසින්-

(අ) බලපත්‍රලාභියකු සමඟ කරන සෑම ගනුදෙනුවක දීම සාධාරණ නිසි උද්‍යෝගයෙන් කටයුතු කිරීම;

(ආ) ව්‍යාජ හෝ ඔහුගේ ගිණුමට හෝ පහසුකමකට සිදු කරන ලද ව්‍යාජ හෝ අනවසර ගනුදෙනු පිළිබඳ තමාට දැනගැනීමට ලැබුණු විට, හැකිතාක් ඉක්මනින් බලපත්‍රලාභියාට ඒ පිළිබඳ වාර්තා කිරීම;

(ඇ) ණය ලබා ගැනීමේ අරමුණ හඳුනා ගැනීම සඳහා සහ එම අරමුණ ඉටුකර ගැනීම සඳහා කිසිදු පැහැර හැරීමකින් තොරව ණය වාරික පොලී ගෙවිය හැකි වන මුදල් ප්‍රමාණයක් ණයක් ලෙස ලබා ගැනීම සඳහා සාධාරණ පියවර ගැනීම;

(ඈ) අනිසි ප්‍රමාදයකින් තොරව යම් ණයක් ප්‍රදානය කිරීම සඳහා හෝ එම ණය සඳහා ඇපයක් භාර ගැනීම සඳහා බලපත්‍රලාභියකුට අවශ්‍ය සියලු තොරතුරු සැපයීම;

(ඉ) ලබාගත් යම් ණයක් නිසි පරිදි ආපසු ගෙවීමට බාධා විය හැකි යම් මූල්‍ය අපහසුතාවක් පිළිබඳ හැකිතාක් ඉක්මනින් බලපත්‍රලාභියා වෙත දැන්වීම; සහ

(ඊ) යම් ණයකට අදාළ ණය වාරික පොලී ගෙවන අතරතුර තමා සම්බන්ධ කර ගැනීමේ

විස්තරවල සිදු වූ යම් වෙනස්කමක් සෑම විටක ම බලපත්‍රලාභියා වෙත දැන්වීම,

කරනු ලැබිය යුතු ය.

IX වන කොටස

## වැරදි විමර්ශනය කිරීම

විමර්ශනය කිරීමේ බලතල, පරීක්ෂා කිරීමේ බලතලවලට අමතරව විය යුතු බව

**54**. මේ කොටසේ විධිවිධාන, මේ පනතේ VII වන කොටස යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සතු බලතල කිසිවකට අමතරව විය යුතු අතර, යම් බලපත්‍රලාභියකු පරීක්ෂා කිරීම සඳහා එකී VII වන කොටස යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සතු බලතල, ඉන් සීමා කරන ලෙස තේරුම් නොගත යුතු ය.

වැරදි විමර්ශනය කිරීම

**55.** (1) 21 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 32 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කිරීමට සම්බන්ධ තැනැත්තකු සම්බන්ධයෙන් අධිකාරියට යම් පැමිණිල්ලක් හෝ තොරතුරක් ලැබුණු අවස්ථාවක, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අධිකාරියට ලැබුණු එම පැමිණිල්ලේ හෝ තොරතුරෙහි සහතික කළ පිටපතක් සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු වෙත ඉදිරිපත් කොට එම පැමිණිල්ල හෝ තොරතුර සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලෙස එම පොලිස් නිලධරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලබන පරිදි එම වරද සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම හෝ විමර්ශනයක් සිදු කිරීමට කටයුතු සැලැස්වීම එම පොලිස් නිලධරයාගේ කාර්යය විය යුතු අතර, එම පොලිස් නිලධරයා විසින්, මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ ලබා දී ඇති සියලු විමර්ශන බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිවධානවල කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු, මේ පනත යටතේ වන වරදකට අදාළ යම් කටයුත්තකට සම්බන්ධ බවට විශ්වාස කිරීමට පොලිස් නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක, එම පොලිස්

නිලධරයා විසින්, එම වරද සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම හෝ විමර්ශනයක් සිදු කිරීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය හැකි ය. මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ ලබා දී ඇති සියලු විමර්ශන බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

තොරතුරු ලබා ගැනීම සඳහා වන අධිකරණ නියෝගය

**56.** යම් තැනැත්තකු විසින්, 55 වන වගන්තිය යටතේ විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයකු විසින් නියම කරනු ලැබූ විට, යම් තොරතුරක්, පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, නාමලේඛනයක් හෝ වෙනත් යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් සැපයීම පැහැර හරිනු ලැබූ හෝ ව්‍යාජ, සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරක්, පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, නාමලේඛනයක් හෝ වෙනත් යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් සපයනු ලැබූ අවස්ථාවක, සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්-

(අ) 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති තැනැත්තාගේ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන යම් පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, නාමලේඛනයක් සහ වෙනත් යම් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලීමෙහි නම් කර ඇති යම් තැනැත්තකුට බලය දෙමින්; හෝ

(ආ) 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර කරන ලද නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති තැනැත්තාගේ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන යම් පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, නාමලේඛනයක් සහ වෙනත් යම් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් නියෝගයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකුට එහි නිශ්චිතව දක්වා ඇති ස්ථානයක දී ඉදිරිපත් කරන ලෙස එකී තැනැත්තාට

හෝ එකී තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකුට, හවුල්කරුවකුට, සාමාජිකයකුට, ලේකම්වරයකුට, කළමනාකරුවකුට, සේවා නියුක්තයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවකුට හෝ විගණකවරයකුට නියම කරමින්,

නියෝගයක් නිකුත් කරන ලෙස, මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

**57.** (1) සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, ඕනෑම විටක දී, 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර විමර්ශනයට ලක් වන තැනැත්තකුගේ ගමන් බලපත්‍රය පරිරෝධනය කරන ලෙස මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

විමර්ශනයට ලක් වන තැනැත්තන්ගේ ගමන් බලපත්‍ර පරිරෝධනය කිරීම

(2) 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර විමර්ශනයට ලක් වන තැනැත්තා පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක-

(අ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාපිත මණ්ඩලයක් නම්, එම සංස්ථාපිත මණ්ඩලයේ යම් කොටස් හිමියකුගේ, අධ්‍යක්ෂවරයකුගේ, කළමනාකරුවකුගේ හෝ නිලධරයකුගේ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, හවුල් ව්‍යාපාරයක් නම්, එම හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුගේ; හෝ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය, හවුල් ව්‍යාපාරයක් නොවන වෙනත් යම් සංස්ථාපිත නොවන මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ හෝ ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිව යුතු යම් නිලධරයකුගේ,

ගමන් බලපත්‍රය පරිරෝධනය කරන ලෙස සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, අවශ්‍ය පරිදි, ඉල්ලීමක් හෝ ඉල්ලීම් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

වැරදි සමථයට පත් කිරීම

**58.** මේ පනත යටතේ වරදක් සිදු කර ඇති අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, අධිකාරියේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, රුපියල් මිලියන පහක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට එම වරද සමථයට පත් කරනු ලැබිය හැකි ය.

X වන කොටස

**වැරදි සහ දණ්ඩන**

සේවානියුක්තයන් විසින් සිදු කරන වැරදි

**59.** බලපත්‍රලාභියකුගේ අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, කළමනාකරුවකු, නිලධරයකු, සේවානියුක්තයකු, හවුල්කරුවකු, ධූර දරන්නකු හෝ විගණකවරයකුව සිටිමින්-

(අ) එම බලපත්‍රලාභියා විසින් මේ පනතේ නියමයන්ට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා සියලු සාධාරණ පියවර ගැනීම පැහැර හරින;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන යම් විධානයකට හෝ සාදනු ලබන යම් රීතියකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන යම් නිර්දේශනයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින;

(ඈ) මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන හෝ පළ කරනු ලබන යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ආරක්ෂා කිරීම සඳහා සියලු සාධාරණ පියවර ගැනීම පැහැර හරින;

(ඉ) එම බලපත්‍රලාභියාගේ ව්‍යාපාරික කටයුතු, ගනුදෙනු, තත්ත්වයන්, වත්කම් හෝ වගකීම් හෝ ගිණුම්වලට අදාළ යම් පොතකට, වාර්තාවකට,

ලිපි ගොනුවකට, නාමලේඛනයකට හෝ වෙනත් යම් ලේඛනයකට හෝ ප්‍රකාශයකට ව්‍යාජ සටහනක් ඇතුළත් කරන හෝ ව්‍යාජ සටහනක් ඇතුළත් කිරීමට කටයුතු සලස්වන;

(ඊ) එම බලපත්‍රලාභියාගේ ව්‍යාපාරික කටයුතු, ගනුදෙනු, තත්ත්වයන්, වත්කම් හෝ වගකීම් හෝ ගිණුම්වලට අදාළ යම් පොතකට, වාර්තාවකට, ලිපි ගොනුවකට, නාමලේඛනයකට හෝ වෙනත් යම් ලේඛනයකට හෝ ප්‍රකාශයකට සටහනක් ඇතුළත් නොකර හරින හෝ සටහනක් ඇතුළත් නොකර හැරීමට කටයුතු සලස්වන;

(උ) එම බලපත්‍රලාභියාගේ ව්‍යාපාරික කටයුතු, ගනුදෙනු, තත්ත්වයන්, වත්කම් හෝ වගකීම් හෝ ගිණුම්වලට අදාළ යම් පොතක, වාර්තාවක, ලිපි ගොනුවක, නාම ලේඛනයක හෝ වෙනත් යම් ලේඛනයක හෝ ප්‍රකාශයක ඇති යම් සටහනක් වෙනස් කරන, අපහරණය කරන, සඟවන, මකා දමන හෝ විනාශ කරන හෝ එවැනි යම් සටහනක් වෙනස් කිරීමට, අපහරණය කිරීමට, සැඟවීමට, මකා දැමීමට හෝ විනාශ කිරීමට කටයුතු සලස්වන; හෝ

(ඌ) එම බලපත්‍රලාභියාගේ සැබෑ තත්ත්වය සැඟවීමේ කාර්යය සඳහා පොත් කට්ටල, වාර්තා, ලිපි ගොනු, නාමලේඛන හෝ වෙනත් යම් ලේඛන කිහිපයක් පවත්වාගෙන යන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

පනත උල්ලංඝනය කිරීම සඳහා වන දණ්ඩනය

**60.** (1) 53 වන වගන්තිය හැර මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් විධානයක් හෝ රීතියක්, උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර,

මේ පනතින් ඒ සඳහා වෙනත් කිසිදු දඬුවමක් ප්‍රකාශිතව ම නියම කර නොමැති අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක-

(අ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂකවරයකු ම, කළමනාකරුවකු ම, නිලධරයකු ම හෝ ලේකම්වරයකු ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, හවුල් ව්‍යාපාරයක් නම්, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුම; හෝ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය, හවුල් ව්‍යාපාරයක් නොවන වෙනත් යම් සංස්ථාපිත නොවන මණ්ඩලයක් නම්, මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, තම අනුදැනුමෙන් තොරව එම වරද සිදු කරනු ලැබ ඇති බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමට තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, එම සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ ලේකම්වරයකු හෝ එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ එම සංස්ථාපිත නොවන මණ්ඩලයේ නිලධරයකු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට අනුබල දෙන, කුමන්ත්‍රණය කරන හෝ තැත් කරන යම් තැනැත්තකු වරදක් සිදු

කරනු ලබන අතර, මේ පනත යටතේ අදාළ ප්‍රධාන වරදට දඬුවම් කරනු ලබන ආකාරයෙන් ම එම තැනැත්තාට ඒ සඳහා දඬුවම් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් දඩයක් ගෙවන ලෙස ආඥා කර ඇති, සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක සාමාජිකයකු විසින් එම දඩය හෝ ඉන් කොටසක් ගෙවීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, එම සංස්ථාපිත මණ්ඩලයේ, හවුල් ව්‍යාපාරයේ හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයේ යම් අරමුදල් යොදා ගනු ලැබුවහොත්, එවිට, ඔහු වරදක් සිදු කරනු ලබන්නේ ය.

## XI වන කොටස

## මුදල්

අධිකාරියේ අරමුදල

**61.** (1) අධිකාරියට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) පාර්ලිමේන්තුව විසින්, අධිකාරියේ මූලික ප්‍රාග්ධනය ලෙස අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන්නා වූ, රුපියල් මිලියන සියයක මුදල් ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලින් වෙන් කරනු ලැබිය යුතු අතර, එම මුදල් ප්‍රමාණය මෙහි (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) අරමුදලට -

(අ) අධිකාරියේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල, සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, සහ ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත බලපත්‍රලාභියකුගෙන් හැර කවර වූ හෝ මූලාශ්‍රයකින් ආදායම්, ගාස්තු, අයකිරීම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්,

බැර කරනු ලැබිය යුතු ය.

(4) අරමුදලින්-

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන්; හෝ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවන ලෙස නියම කර ඇති සියලු මුදල් ප්‍රමාණයන්,

ගෙවනු ලැබිය යුතු ය.

(5) අධිකාරිය විසින්, එහි අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය.

(6) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, එළඹෙන මුදල් වර්ෂය සඳහා අධිකාරියේ ප්‍රාග්ධන අවශ්‍යතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයක් රඳවා තබා ගැනීමෙන් පසු, එක් එක් මුදල් වර්ෂය අවසානයේ අධිකාරියේ ශුද්ධ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම

**62.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරිය විසින්, අධිකාරියේ ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ එහි අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා අදාළ විය යුතු ය.

(4) අධිකාරිය විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමඟ, එකී වාර්තාව අදාළ වන මුදල් වර්ෂය අවසානයේ සිට මාස පහක් ඇතුළත, විගණනය කළ ගිණුම් ප්‍රකාශය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින්, එම ප්‍රකාශය සහ වාර්තාව ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත එම ප්‍රකාශය සහ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම

**63.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකාරියේ මුදල් පාලනය සහ ගිණුම් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## XII වන කොටස

### සාමාන්‍ය

ගනුදෙනු පිළිබඳ රහස්‍යභාවය

**64.** (1) යම් බලපත්‍රලාභියකුගේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම, නිලධරයකු ම, සේවානියුක්තයකු ම, අනුයෝජිතයකු ම සහ 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, එම බලපත්‍රලාභියාගේ, එහි ගනුදෙනුකරුවන්ගේ සියලු ගනුදෙනු සහ යම් තැනැත්තකුගේ ගිණුම් තත්ත්වය සහ ඊට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් උපරිම රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබිය යුතු අතර-

(අ) (i) අධිකරණයක් විසින්;

(ii) එකී කරුණ අදාළ වන තැනැත්තා විසින්,

එසේ කිරීමට නියම කරනු ලැබූ අවස්ථාවක;

(ආ) එම අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ, නිලධරයාගේ, සේවා නියුක්තයාගේ සහ අනුයෝජිතයාගේ කාර්ය කිරීමේ දී; හෝ

(ඇ) මේ පනතේ යම් විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූලව කටයුතු කිරීම සඳහා,

මිස, එවැනි යම් කරුණක් හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බලපත්‍රලාභියකු විසින්, ස්වකීය ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය ඵලදායී ලෙස ආරක්ෂා වන ආකාරයකින් ගනුදෙනුකරුවන්ගේ දත්ත රැස් කිරීම, ගබඩා කිරීම, බැලීම සහ භාවිත කිරීම කරනු ලැබිය යුතු ය.

තොරතුරුවල රහස්‍යභාවය

**65.** (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය කිරීමේ දී මිස, අධිකාරියේ සෑම සාමාජිකයකු, නිලධරයකු සහ සේවා නියුක්තයකු විසින් ම-

(අ) මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති යම් ඉල්ලුම්කරුවකුගේ;

(ආ) බලපත්‍රලාභියකුගේ හෝ එම බලපත්‍රලාභියාගේ යම් ගනුදෙනුකරුවකුගේ; හෝ

(ඇ) යම් රජයේ ආයතනයක,

කටයුතු සම්බන්ධයෙන්, මේ පනත හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ ස්වකීය කාර්ය කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබුණු සියලු කරුණුවල සහ යම් තොරතුරක රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ආධාර කිරීම කරනු ලැබිය යුතු අතර -

(i) අධිකාරියට, අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ තත්කාර්ය සඳහා අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද අධිකාරියේ නිලධරයකුට හැර, වෙනත් යම් තැනැත්තකුට එවැනි යම් කරුණක් හෝ තොරතුරක් සන්නිවේදනය කරන; හෝ

(ii) අවසර නොලත් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති යම් ඉල්ලුම්කරුවකුට, බලපත්‍රලාභියකුට, බලපත්‍රලාභියකුගේ යම් ගනුදෙනුකරුවකුට හෝ යම් රජයේ ආයතනයකට අදාළ යම් පොත්වලට, ලියකියවිලිවලට හෝ වෙනත් වාර්තාවලට ප්‍රවේශ වීමට, ඉඩදෙන හෝ අවසර දෙන,

එවැනි යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව, අධිකාරියේ යම් තොරතුරක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනිමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන සහ මේ පනතේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් හෝ ගැටුමක් ඇතිවුවහොත්, එවිට, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

තැපැල් කිරීම නිසි දැන්වීමක් ලෙස සැලකිය යුතු බව

**66.** මේ පනත යටතේ බලපත්‍රලාභියකු වෙත යම් දැන්වීමක් භාරදිය යුතු අවස්ථාවක නැතහොත් මේ පනත යටතේ ගන්නා ලද යම් නියාමන ක්‍රියාමාර්ගයක් අධිකාරිය විසින් බලපත්‍රලාභියකු වෙත දන්වනු ලබන අවස්ථාවක, එම දැන්වීම හෝ තොරතුරු එහි ප්‍රධාන නිලධරයා අමතා බලපත්‍රලාභියාගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනයට තැපැල් කළ බවට වන සාක්ෂි එම දැන්වීම එම බලපත්‍රලාභියා වෙත භාරදුන් බව ඔප්පු කිරීමට ප්‍රමාණවත් වන්නේ ය.

මහ බැංකුව විසින් අධිකාරිය වෙත මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව

**67.** (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මහ බැංකුව විසින්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා සහ බලපත්‍රලාභියකු නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ගුණාත්මක වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා අධිකාරිය වෙත මාර්ගෝපදේශ

නිකුත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින්, උචිත රීති සෑදීම නැතහොත් විධාන නිකුත් කිරීම මගින් හෝ වෙනත් යම් උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම මගින්, මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන එකී මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින්, කලින් කල, අධිකාරියෙන් තොරතුරු ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, එම තොරතුරු නිසි වේලාවට ඉදිරිපත් කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

බලපත්‍රලාභීන් පිළිබඳ නාමලේඛනය

**68.** (1) අධිකාරිය විසින්, බලපත්‍රලාභීන් සඳහා වෙන වෙනම නාමලේඛන පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, නිකුත් කරන ලද බලපත්‍රවල විස්තර, එක් එක් බලපත්‍රය මත පනවන ලද කොන්දේසි සහ නියම සහ අධිකාරිය විසින් උචිත යයි සලකනු ලබන වෙනත් යම් තොරතුරු එහි වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින්, එක් එක් බලපත්‍රය නිකුත් කිරීමේ පදනම සහ එම බලපත්‍ර නිකුත් කිරීමේ දී පනවන ලද කොන්දේසි සහ නියම ද, බලපත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු ද, සම්බන්ධයෙන් වාර්තාවක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

බලපත්‍රලාභීන් පිළිබඳ ලැයිස්තුවක් පළ කළ යුතු බව

**69**. අධිකාරිය විසින්, මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇති බලපත්‍රලාභීන් පිළිබඳ ලැයිස්තුවක් දක්වමින් කලින් කල, යටත් පිරිසෙන්, ශ්‍රී ලංකාව තුළ සංසරණය වන එක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි දිනපතා පුවත්පතකවත් දැන්වීමක් පළ කරනු ලැබිය හැකි ය.

ව්‍යාපාර නම්වල "ණය", "ක්ෂුද්‍ර ණය", "ණය දීම", "ණය දෙන්නන්", "මුදල් ණයට දෙන්නන්" සහ "ක්ෂුද්‍රමූල්‍ය" යන වචන භාවිත කිරීම

**70**. (1) බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු හෝ 20 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිදහස් කර ඇති ආයතනයක් නොවන කිසිම තැනැත්තකු විසින්, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතයකින් තොරව, එහි නමේ හෝ විස්තරයේ කොටසක් ලෙස "ණය", "ක්ෂුද්‍ර ණය", "ණය දීම", "ණය දෙන්නන්", "මුදල් ණයට දෙන්නන්" හෝ "ක්ෂුද්‍රමූල්‍ය" යන වචන කිසිවක් හෝ එම වචනවල ප්‍රභේද හෝ අක්ෂර පරිවර්තනයන් කිසිවක් හෝ වෙනත් යම් භාෂාවක ඇති ඊට සමාන වූ වචනයක් හෝ තනිව හෝ වෙනත් යම් වචනයක් හා සංයුක්තව භාවිත කරනු නොලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් හෝ 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් නිදහස් කර ඇති අස්තිත්වයක් නොවන කිසිම තැනැත්තකු විසින්, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතයෙන් තොරව, එහි නමෙහි කොටසක් ලෙස හෝ එහි විස්තරයේ කොටසක් ලෙස "ක්ෂුද්‍රමූල්‍ය" යන වචනය හෝ එහි ප්‍රභේද හෝ අක්ෂර පරිවර්තනයන් කිසිවක් හෝ වෙනත් යම් භාෂාවක ඇති ඊට සමාන වූ වචනයක් හෝ තනිව හෝ වෙනත් යම් වචනයක් හා සංයුක්තව භාවිත කරනු නොලැබිය යුතු ය.

මාධ්‍ය ආයතනවල වගකීම්

**71.** (1) 20 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, මුදල් ණයට දීම සඳහා, අර්පණයක් සිදු කරන යම් තැනැත්තකුගෙන්, එකී කටයුත්තට අදාළ යම් වෙළෙඳ දැන්වීමක් හෝ ව්‍යාපාර ප්‍රවර්ධක දැන්වීමක් පළ කිරීමට පෙර, ඔහු මේ පනත යටතේ බලපත්‍රයක් ලබා ඇත්දැයි විමසා බැලීම යම් මාධ්‍ය ආයතනයක කාර්යය විය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ බලපත්‍ර නොලත් හෝ මේ පනතේ 20 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිදහස් කර නොමැති තැනැත්තකු විසින් මුදල් ණයට දීමේ ව්‍යාපාරය හෝ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය සඳහා අර්පණයක් සිදු කරමින් කරනු ලබන වෙළෙඳ දැන්වීම් පළ කිරීමෙන් වළකින ලෙස යම් මාධ්‍ය ආයතනයකට නියම කරමින් එම මාධ්‍ය ආයතනය වෙත දැන්වීමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ කාර්ය සඳහා බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන "ණය ආයතන" ලෙස සැලකිය යුතු බව

**72.** (1) කාලානුරූපී සහ නිරවද්‍ය ණය තොරතුරු ලබාදීම සඳහා ප්‍රකාශකරුවකුට ඇති හැකියාව සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන නිර්දේශය මත, අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ බලපත්‍රලත් යම් මුදල් ණයට දෙන්නකු හෝ ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ කාර්යය සඳහා ණය දෙන ආයතනයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින් -

(අ) මේ පනත යටතේ බලපත්‍රලත් යම් මුදල් ණයට දෙන්නකුගෙන් හෝ ක්ෂුද්‍රමූල්‍ය ආයතනයකින්, ඔවුන්ගේ ණය ගැනුම්කරුවන් හෝ භව්‍ය ණය ගැනුම්කරුවන් පිළිබඳ ණය සහ මූල්‍ය තොරතුරු එකතු කිරීම, එම තොරතුරු සංසන්දනය කිරීම, සංස්ලේෂණය කිරීම සහ ගබඩා කිරීම කරනු ලැබිය හැකි ය; සහ

(ආ) ඉල්ලීමක් කරනු ලැබූ විට -

(i) මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂකවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු ලෙස පත්කිරීම, තෝරා පත්කර ගැනීම හෝ නාමයෝජනා කිරීම සඳහා යම් තැනැත්තකු සතු යෝග්‍යතාව නිශ්චය කරගැනීමේ කාර්යය සඳහා සහ මූල්‍ය ආයතන නියාමනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ සහ එම ආයතනවල ණය විශ්ලේෂණයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා, මහ බැංකුව වෙත;

(ii) යම් තැනැත්තකුගේ ණය ලැබීමට ඇති සුදුසුකම හෝ ණය තත්ත්වය තක්සේරු කිරීමේ හෝ නිශ්චය කරගැනීමේ සහ දැනට සිටින ණය ගැනුම්කරුවන් සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ සහ දැනට සිටින ණය ගැනුම්කරුවන්ගේ හිඟ ණය මුදල් එකතු කිරීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ බලපත්‍රලත් යම් මුදල් ණයට දෙන්නකු හෝ ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් හෝ යම් මූල්‍ය ආයතනයක් වෙත;

(iii) මේ පනත යටතේ බලපත්‍රලත් යම් ආයතනයක ණය ගැනුම්කරුවකු හෝ භව්‍ය ණය ගැනුම්කරුවකු සහ එම තොරතුරු අදාළ වන වෙනත් යම් තැනැත්තකු වෙත;

(iv) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ එම සහන ප්‍රදානය කිරීම සඳහා අදාළ වන නීතිය ප්‍රකාර බලපත්‍රයක් නිකුත් කිරීම හෝ සහනයක් ප්‍රදානය කිරීම පිණිස ඉල්ලුම්කරුවකුගේ ණය ලැබීමට ඇති සුදුසුකම තක්සේරු කිරීම සඳහා එම තොරතුරු, ලබාගැනීමට හිමිකම් ඇති බවට මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් රජයේ නියෝජනායතනයක් හෝ ආයතනයක් වෙත;

(v) තොරතුරු අදාළ වන තැනැත්තාගේ කැමැත්ත ඇතිව, ප්‍රතිරක්ෂණය කිරීමේ හෝ එම තැනැත්තාගේ ණය ලැබීමට ඇති සුදුසුකම සහ රක්ෂණීයභාවය නිශ්චය කරගැනීමේ කාර්යය සඳහා, යම් රක්ෂණ සමාගමක් වෙත; හෝ

(vi) අධිකාරියේ නිර්දේශය මත, කලින් කල, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් මේ වගන්තියේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත,

ණය සහ මූල්‍ය තොරතුරු හෝ එම ප්‍රභේදයට අයත් යම් තොරතුරු රහසිගතව ලබාදිය හැකි ය.

(3) අධිකාරිය විසින්, (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තොරතුරු සැපයීමේ දී, එම තොරතුරු භාවිත කරනු ලැබිය හැකි කාර්ය හඳුනාගැනීම ද ඇතුළුව අධිකාරිය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

**73.** මේ පනතේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව පවරන ලද යම් අපරාධ නඩු කටයුත්තක දී, මුදල් ණයට දීමේ ව්‍යාපාරය හෝ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා තමා වෙත බලපත්‍රයක් ප්‍රදානය කර ඇති බව ඔප්පු කිරීමේ භාරය එම තැනැත්තා සතු විය යුතු ය.

බලපත්‍රයක් ප්‍රදානය කර ඇති බව ඔප්පු කිරීම

**74.** මේ පනත යටතේ අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද, එම ලේඛනයේ සත්‍ය පිටපතක් බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහතික කරන ලද්දා වූ ද, ලේඛනයක යම් පිටපතක්, එම ලේඛනයේ මුල් පිටපත පිළිබඳ සාක්ෂියක් ලෙස යම් අධිකරණයක දී ආවේශ්‍ය විය යුතු ය.

සහතික කළ පිටපත්, මුල් පිටපත් පිළිබඳ සාක්ෂියක් ලෙස පිළිගත යුතු බව

**75.** (80 වන අධිකාරය වූ) මුදල් ණයට දීමේ ආඥාපනතේ 5 වන වගන්තිය හැර විධිවිධාන යම් බලපත්‍රලාභියකු සඳහා අදාළ නොවිය යුතු ය.

මුදල් ණයට දීමේ ආඥාපනත අදාළ වීමෙන් බලපත්‍රලාභීන් නිදහස් කර ඇති බව

**76**. මේ පනත යටතේ අධිකාරියේ සාමාජිකයකු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ යම් සේවානියුක්තයකු හෝ අධිකාරිය හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද යම් අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී, මේ පනත යටතේ හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නිර්දේශනයක්, රීතියක්, නියමයක් හෝ විධානයක් යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ දී හෝ කරන ලදැයි කියනු ලබන ස්වකීය වගකීම් ඉටුකිරීමේ දී හෝ එකී වගකීම් ඉටු කිරීමට අදාළව තමා නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් යුතුව ක්‍රියා කළ බව ද, සද්භාවයෙන් කටයුතු කළ බව ද ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එය ඔහුට විත්තිවාචකයක් විය යුතු ය.

අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී විත්තිවාචකයක් වීම

**77.** අවස්ථාවෝචිත පරිදි, අධිකාරියේ සාමාජිකයකු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ යම් සේවානියුක්තයකු හෝ අධිකාරිය හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන

දරන ලද වියදම් අරමුදලින් ගෙවිය යුතු බව

ලද යම් නිර්දේශනයක්, විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් යටතේ කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියෙහි පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඔහු විසින් දරන ලද යම් වියදමක් එම ක්‍රියාව සිදු කර ඇත්තේ සද්භාවයෙන් බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් සහ ඔහු විසින් එම මුදල එම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී අයකර ගෙන නොමැති නම්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව*

**78.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ III වන කොටසේ I වන පරිච්ඡේදයේ “අල්ලස් හෝ දූෂණවලට අදාළ වැරදි” යන ශීර්ෂය යටතේ වන විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනතේ විධිවිධාන සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ වන බවට සලකනු ලැබිය යුතු ය.

*අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවානියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව*

**79.** අධිකාරියේ සියලු ම සාමාජිකයන්, අධිකාරියේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා සහ අධිකාරියේ සියලු ම නිලධරයන් සහ සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

## XIII වන කොටස

## අන්තර්කාලීන විධිවිධාන

*මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යන තැනැත්තන් විසින් මාස විසිහතරක් දක්වා එකී ව්‍යාපාරය දිගට ම කරගෙන යා හැකි බව*

**80**. (1) 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී මුදල් ණයට දීමේ ව්‍යාපාරය කර ගෙන යන යම් තැනැත්තකු විසින්-

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස විසි හතරක කාලසීමාවක් දක්වා එකී ව්‍යාපාරය දිගට ම කරගෙන යනු ලැබිය හැකි ය; සහ

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවමින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් දිනයකින් පසු බලපත්‍රලත් මුදල් ණයට දෙන්නකු ලෙස ස්වකීය ව්‍යාපාරය දිගට ම කරගෙන යාම පිණිස බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලබන දිනය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස දොළහකට පසුව වූ දිනයක් නොවිය යුතු ය.

ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කිරීම

**81.** (1) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කරනු ලැබුව ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ක්‍රියාත්මකව පවතින, එම පනත යටතේ නිකුත් කරන ලද සෑම නියෝගයක් ම, දැන්වීමක් ම, නියමයක් ම, නිර්දේශනයක් ම, රීතියක් ම, මාර්ගෝපදේශයක් ම හෝ විධානයක් ම, පනවන ලද සෑම නියම කිරීමක් ම, කරන ලද සෑම තීරණයක් ම හෝ පැවරීමක් ම, එම නියෝගය, දැන්වීම, නියමය, නිර්දේශනය, රීතිය, මාර්ගෝපදේශය, විධානය, නියම කිරීම, තීරණය හෝ පැවරීම මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනතේ විධිවිධාන යටතේ, අවස්ථාවෝචිත පරිදි, නිකුත් කරන ලද, පනවන ලද හෝ කරන ලද නියෝගයක්, දැන්වීමක්, නියමයක්, නිර්දේශනයක්ම, රීතියක්, මාර්ගෝපදේශයක්, විධානයක්, නියම කිරීමක්, තීරණයක් හෝ පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) නියමිත දින සිට බලාත්මක වන පරිදි, නියමිත දිනට පෙරාතුවම වූ දිනයේ දී අවසන් නොවී පවතින්නා වූ, ඉවත් කරන ලද පනත යටතේ ආරම්භ කරනු ලැබූ සියලු පරීක්ෂණ හෝ ගනු ලැබූ සියලු අධීක්ෂණ පියවර, මේ පනත යටතේ, අවස්ථාවෝචිත පරිදි, පවත්වනු ලැබූ නැතහොත් පවත්වනු ලබමින් පවතින පරීක්ෂණ හෝ ගනු ලැබූ නැතහොත් ගනු ලබමින් පවතින අධීක්ෂණ පියවර ලෙස සලකනු ලැබිය යුතු ය.

ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලත් ආයතන මේ පනත යටතේ බලපත්‍රලත් ආයතන ලෙස සැලකිය යුතු බව

**82.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයක් කරගෙන යනු ලබන-

(අ) ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලත් යම් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්; හෝ

(ආ) ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, මේ පනතේ 32 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූල වන්නා වූ ද, යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්,

මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි මේ පනතේ 32 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇති බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, එහි පවත්නා නෛතික ස්වරූපයෙන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් දක්වා ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන යනු ලැබිය යුතු අතර, ඒ කාලසීමාව තුළ මේ පනතේ 32 වන වගන්තියේ (4) වන උපවගන්තියට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින ලද්දා වූ, ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්, ලියාපදිංචිය අවලංගු කර ඇති ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ප්‍රකාර පවරන ලද්දා වූ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී එහි සඳහන් යම් අධිකරණයක විභාග

වෙමින් පවතින්නා වූ ද, සියලු නඩු, නඩු කටයුතු හෝ කරුණු මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධිවිධාන ප්‍රකාර එකී අධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**83**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"පූර්ණ වයස" යන්නට, (66 වන අධිකාරය වූ) පූර්ණ වයස් ආඥාපනත යටතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතුය;

"ආසියානු සංවර්ධන බැංකුව" යන්නෙන්, 1966 අංක 21 දරන අසියානු සංවර්ධන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආසියානු සංවර්ධන බැංකුව අදහස් වේ;

"ආශ්‍රිත සමාගම" යන්නට, ආශ්‍රිත සමාගම් සහ ඒකාබද්ධ ව්‍යාපාරවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLAS) 28 යටතේ හෝ කලින් කල, ශ්‍රී ලංකාව තුළ අදාළ වන වෙනත් යම් සමාන ගිණුම් ප්‍රමිතියක් යටතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තකු; හෝ

(ආ) එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ;

“ණය ගැනුම්කරු” යන්නෙන්, බලපත්‍රලාභියකු විසින් මුදල් ණයට දෙන ලද යම් තැනැත්තකු අදහස් වේ;

“මහ බැංකුව” යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකුව පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

“ළඟම ඥාතීන්” යන්නෙන්, කලත්‍රයා, ගෘහස්ථ හවුල්කරු, ළමයින්, දෙමාපියන් සහ ලේ ඥාතීත්වය මගින් හෝ දරුකමට හදා ගැනීම මගින් සහෝදරයන් වන තැනැත්තන් අදහස් වේ;

“සමපාර්ශ්වීය ඇපය” යන්නෙන්, යම් ණය ගැනුම්කරුවකුට ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සඳහා සමපාර්ශ්වීය ඇපයක් ලෙස එම ණය ගැනුම්කරුගෙන් ලබාගත් ඉතිරි කිරීමේ තැන්පතුවක් අදහස් වේ;

“ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය” යන්නෙන්, 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය අදහස් වේ;

"තැන්පතුව" යන්නට, කලින් කල, සංශෝධනය විය හැකි, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මූල්‍ය ආයතනය" යන්නට, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතින් ඊට ලබාදී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මූල්‍ය නියාමන අධිකාරිය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ යම් නිශ්චිත ක්ෂේත්‍රයක් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා නීතියෙන් පිහිටුවන ලද යම් සංස්ථාපිත මණ්ඩලයක් අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඇතුළත් වේ;

"පාලක සමාගම" යන්නට, 2007 අංක 07 දරන සමාගම් පනතින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"නැවත ගොඩනැගීම හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව" යන්නෙන්, 1944 ජූලි මස ඇමරිකා එක්සත් ජනපදයේ නිව් හැම්ප්ශයර්හි, බ්‍රෙටන් වුඩ්ස් නගරයේ දී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ මුදල් සහ මූල්‍ය සමුළුවේ දී ඇති කර ගන්නා ලද ගිවිසුම් ප්‍රකාර පිහිටුවන ලද නැවත ගොඩනැගීම හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව අදහස් වේ;

"ජාත්‍යන්තර සංවර්ධන සංගමය" යන්නෙන්, 1961 අංක 7 දරන ජාත්‍යන්තර සංවර්ධන සංගමය ගිවිසුම් පනතේ උපලේඛනය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර සංවර්ධන සංගමය අදහස් වේ;

"ජාත්‍යන්තර මුදල් සංස්ථාව" යන්නෙන්, 1978 අංක 28 දරන ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් පනතේ උපලේඛනය ප්‍රකාර පිහිටුවන ලද ජාත්‍යන්තර මුදල් සංස්ථාව අදහස් වේ;

"ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයා" යන්නෙන්, යම් අධ්‍යක්ෂවරයකු ද ඇතුළුව, ඍජුව ම හෝ අන්‍යාකාරයකින් යම් බලපත්‍රලාභියකුගේ කටයුතු සැලසුම් කිරීමේ, මෙහෙයවීමේ සහ පාලනය කිරීමේ බලය සහ වගකීම ඇති තැනැත්තකු අදහස් වේ;

"වෙළෙඳපොළ හැසිරීම" යන්නෙන්, විකුණුම්, ප්‍රවර්ධන, බෙදාහැරීම්, පරිපාලනය සහ ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු මාර්ගයෙන් ස්වකීය ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන, වෙළෙඳපොළක සහභාගිකයන්ගේ චර්යාව හෝ හැසිරීම අදහස් වේ;

"ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය" යන්නෙන්, ණයට දෙන්නාගේ සහ ණය ගැනුම්කරුගේ තිරසරභාවය පවත්වාගෙන යන අතර ම සමාජ සවිබලගැන්වීමේ මූලික පරමාර්ථය ඇතිව අඩු ආදායම්ලාභී තැනැත්තන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ට පොලියක් මත හෝ ණය දීමෙන් ලැබෙන මුදල්වලින් ජනිත වන ලාභය හෝ පාඩුව ණයට දෙන්නා සහ ණය ගැනුම්කරු අතර බෙදා ගැනීමේ ප්‍රතිඡ්ඨාව මත කරනු ලබන මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ මේ පනතේ උපලේඛනයට අනුකූලව වෙනත් මූල්‍ය සේවා සැපයීම අදහස් වේ;

"ක්ෂුද්‍රමූල්‍ය ආයතන" යන්නෙන්, මේ පනතේ V වන කොටස යටතේ අධිකාරිය විසින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති යම් ආයතනයක් අදහස් වේ;

“අමාත්‍යවරයා” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

“ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය” යන්නෙන්, ඉවත් කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 20 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලියාපදිංචි සහතිකයක් ලබා ගෙන ඇති රාජ්‍ය නොවන සංවිධානයක් හෝ මේ පනතේ 32 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් වේ;

“මුදල් ණයට දෙන්නා” යන්නෙන්, තමා වෙනත් යම් ව්‍යාපාරයක් කර ගෙන යනු ලැබුව ද නොලැබුව ද, මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යන හෝ මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යන බවට යම් ආකාරයකින් ප්‍රචාරණය කරන හෝ නිවේදනය කරන හෝ පෙනී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

“මුදල් ණයට දීමේ ගිවිසුම” යන්නෙන්, යම් බලපත්‍රලාභියකු විසින්, යම් ණය ගැනුම්කරුවකුට ණයට දෙනු ලබන මුදල් ප්‍රමාණයක් සඳහා අදාළ වන නියම සහ කොන්දේසි අර්ථ නිරූපණය කරමින් යම් බලපත්‍රලාභියකු සහ ණය ගැනුම්කරුවකු අතර ඇති කරගනු ලබන ලිඛිත අවබෝධතාවයක් අදහස් වන අතර, එම ලිඛිත අවබෝධතාවයට කරනු ලබන යම් සංශෝධනයක්, එකතු කිරීමක් හෝ පරිපූරකයක් ද ඊට ඇතුළත් වේ;

“මුදල් ණයට දීමේ ව්‍යාපාරය” යන්නෙන්, යම් මුදල් ණයට දෙන්නකු යම් ව්‍යාපාරයක් කරගෙන යනු

ලැබුව ද නොලැබවු ද, එකී මුදල් ණයට දෙන්නා විසින් ඇපයක් ඇතිව හෝ ඇපයක් නොමැතිව පොලියක් මත යම් ණය ගැනුම්කරුවකුට මුදල් ණයට දීම අදහස් වන අතර, ජනිත වන ලාභ හෝ පාඩු මුදල් ණයට දෙන්නකු සහ ණය ගැනුම්කරුවකු අතර බෙදා ගැනීමේ හේතුව මත යම් මුදල් ප්‍රමාණයක් ණයට දීම ද ඊට ඇතුළත් විය යුතු ය;

“ධුර දරන නිලධරයා” යන්නෙන්, සමිතියක සභාපතිවරයා, උපසභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා හෝ සමිතියක ඒ හා සමාන ධුරයක් හෝ තනතුරක් දරන වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

“ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා” යන්නෙන්, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;

“සම්බන්ධිත සමාගම” යන්නෙන්,-

(i) එකී සමාගම අනිත් සමාගමේ පාලිත සමාගම හෝ පාලක සමාගම වන අවස්ථාවක;

(ii) එකී සමාගමේ පාලක සමාගම එකී අනිත් සමාගමේ ද පාලක සමාගමක් වන හෝ;

(iii) එකී සමාගම අනිත් සමාගමට සම්බන්ධිත සමාගමකට සම්බන්ධිත වන අවස්ථාවක,

වෙනත් යම් සමාගමකට සම්බන්ධිත සමාගමක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදහස් වේ;

"වැදගත් කළමනාකාරිත්ව සම්බන්ධතාව" යන්නෙන් කොටස් හිමිකාරීත්වය නොසලකා, අධ්‍යක්ෂවරයකු හෝ ජ්‍යෙෂ්ඨ හෝ විධායක කළමනාකාරිත්වයේ යම් සාමාජිකයකු විසින්-

(අ) ඍජුව ම;

(ආ) පොදු පිළිගැනීමෙන්; හෝ

(ඇ) පහත දැක්වෙන එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් මාර්ගයෙන්-

(i) කලත්‍රයා;

(ii) ළමයකු හෝ ළමයකුගේ කලත්‍රයා;

(iii) මුනුපුරකු හෝ මිනිපිරියක හෝ ඔවුන්ගේ කලත්‍රයා;

(iv) මව හෝ පියා; හෝ

(v) සහෝදරයකු හෝ සහෝදරියකු සහ ඔවුන්ගේ කලත්‍රයන්,

ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක පාලනය සහ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් දරනු ලබන පාලන බලය අදහස් වේ;

"සමිතිය" යන්නෙන්, (123 වන අධිකාරය වූ) සමිති අඥාපනත යටතේ ලියාපදංචි කරන ලද සමිතියක් හෝ පාර්ලිමේන්තුවේ පනතක් යටතේ සංස්ථාගත කරන ලද සමිතියක් අදහස් වේ;

‘‘පාලිත සමාගම’’ යන්නට, 2007 අංක 07 දරන සමාගම් පනතින් එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

‘‘සැලකිය යුතු මූල්‍ය සම්බන්ධතාව’’ යන්නෙන්,-

(අ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, වෙනත් යම් සමාගමක් විසින් හෝ යම් පුද්ගලයකු හෝ ඔහුගේ ළඟම ඥාතීන් විසින් එහි කොටස් සම්බන්ධයෙන් දරන්නා වූ තනිව ගත් කල හෝ එක්ව ගත් කල හෝ ගෙවා නිමි අගය එම සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් ඉක්මවන්නා වූ අර්ථලාභී සම්බන්ධතාවක් හෝ යම් පුද්ගලයකු හෝ ඔහුගේ ළඟම ඥාතීන් විසින් හෝ වෙනත් යම් සමාගමක් විසින් එම සමාගම වෙනුවෙන් ලබා දී ඇත්තා වූ ද, එහි ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට නොඅඩු මුදලක් වූ ද, ඇපයක් හෝ හානිපූරණයක් අදහස් වේ; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, යම් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ ළඟම ඥාතීන් විසින් හෝ එම හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් දරන්නා වූ ද, තනිව ගත් කල හෝ එක්ව ගත් කල හෝ එම හවුල් ව්‍යාපාරයේ සියලු හවල්කරුවන් විසින් දායක වී ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි කොටසක් නියෝජනය කරන්නා වූ ද අර්ථලාභී සම්බන්ධතාවක් හෝ යම් පුද්ගලයකු විසින් හෝ එම පුද්ගලයාගේ කලත්‍රයා, මව හෝ පියා හෝ ළමයකු විසින් එම හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ලබා දී ඇත්තා වූ ද, එහි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට නොඅඩු මුදලක් වූ ද ඇපයක් හෝ හානිපූරණයක් අදහස් වේ.

**84.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**උපලේඛනය**

[32 වන වගන්තිය]

බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් විසින් පහත දැක්වෙන ව්‍යාපාරික කටයුතුවල යෙදෙනු ලැබිය හැකි ය:-

(අ) සියලු ම වර්ගයේ ආර්ථික කටයුතු සඳහා අධිකාරිය විසින් පනවනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව මුදල් හෝ ද්‍රව්‍යමය වශයෙන් වන සමපාර්ශ්වීය ඇපයක් ඇතිව හෝ නොමැතිව මූල්‍ය පහසුකම් සැපයීම;

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි බැංකු ව්‍යාපාරය කරගෙන යාම හැර, අධිකාරිය විසින් සාදනු ලබන රීතිවල දක්වා ඇති සීමාවන්ට යටත්ව, ණය ගැනුම්කරුවන්ට සීමිත ඉතිරි කිරීමේ පහසුකම් සැපයීම: ඉතිරි කිරීමේ තැන්පතු විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම;

(ඇ) එය විසින් දෙන ලද ණය මුදල් සහ අත්තිකාරම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා ඕනෑම ආකාරයක චංචල හෝ නිශ්චල දේපළ භාර ගැනීම, ඔඩපනය කිරීම, උකස් කිරීම, ඇපයට තැබීම හෝ පැවරීම;

(ඈ) කාර්මික සහ කෘෂිකාර්මික යෙදවුම්, පශු සම්පත්, යන්ත්‍රසූත්‍ර සහ කාර්මික අමුද්‍රව්‍ය මිල දී ගැනීම, විකිණීම හා සැපයීම සඳහා ණය සැපයීම සහ යම් සංවිධානයක් වෙනුවෙන් එවැනි කාර්මික සහ කෘෂිකාර්මික යෙදවුම්, පශු සම්පත්, යන්ත්‍රසූත්‍ර සහ කාර්මික අමුද්‍රව්‍ය විකිණීම සඳහා අනුයෝජිතයකු ලෙස කටයුතු කිරීම;

(ඉ) එහි මුදල් විචක්ෂණශීලීව ආයෝජනය කිරීම;

(ඊ) ගබඩා කිරීමේ සහ ආරක්ෂාකාරීව රඳවා තබා ගැනීමේ පහසුකම් සැපයීම;

(උ) කුඩා ව්‍යාපාර, ස්වයං රැකියා ව්‍යාපෘති සහ ගෘහ කර්මාන්තවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් එහි ගනුදෙනුකරුවන්ට වෘත්තීයමය උපදේශනය සැපයීම;

(ඌ) ක්ෂුද්‍රමූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ඇති විය හැකි විවිධ අවදානම් ආවරණය කර ගැනීමට යොදන රැකවරණය සේවා හා පහසුකම් ගනුදෙනුකරුවන්ට සැපයීම;

(එ) ගනුදෙනුකරුවන් වෙත කළමනාකරණ, අලෙවිකරණ, තාක්ෂණික සහ පරිපාලනමය උපදේශ ලබා දීම සහ එම ක්ෂේත්‍රවල සේවා ලබා ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම;

(ඒ) ගනුදෙනුකරුවන්ට තාක්ෂණික සහාය සහ පුහුණුව ලබාදීම;

(ඔ) අදාළ අධිකාරියෙන් අවශ්‍ය බලපත්‍රය හෝ අනුමතය ලබා ගැනීමෙන් පසුව, එම අධිකාරියේ රීති සහ නියෝගවලට යටත්ව, උකස් ගැනීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාම;

(ඕ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ සහ අධිකාරිය විසින් පනවනු ලබන යම් කොන්දේසියක් යටතේ කුලී සින්නක්කර ගනුදෙනුවල යෙදීම;

(ක) එම කාර්යය සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව ණය ගැනුම්කරුවන්ට ක්ෂුද්‍ර බඳුදීමේ පහසුකම් සහ ක්ෂුද්‍රණය රක්ෂණ ලබාදීම; සහ

(ග) අධිකාරිය විසින්, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලට නිරතවීමට අවසර දෙනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාරික කටයුත්තක නිරතවීම.